



16




# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT



# 2011

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය
இலங்கை தென்கிழக்குப் பல்கலைக்கழகம்
SOUTH EASTERN UNIVERSITY OF SRI LANKA

# ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය

# 16 වැනි වාර්ෂික වාර්තාව

# 2011

## පටුන

| අනු අංකය. | මාතෘකාව | පිටු අංකය. |
|---|---|---|
| | දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය | |
| | • උසස් අධ්‍යාපන අමාත්‍යංශය | i |
| | • විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | iii |
| | • ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය | iv |
| 1. | උපකුලපතිවරයාගේ සමාලෝචනය | 01 |
| 2. | ශිෂ්‍යයන් සහ සම්පත් පිළිබඳ විස්තරය | 11 |
| 3. | දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තරය | 12 |
| 4. | විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තරය | 13 |
| 5. | අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරය | 13 |
| 6. | උපාධිධාරී සේවා නියුක්තිය - 2011 | 15 |
| 7. | අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරය | 16 |
| 8. | පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිලිබඳ විස්තරය | 18 |
| 9. | වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිලිබඳ විස්තරය | 26 |
| 10. | ප්‍රදානයන් පිළිබඳ විස්තරය | 26 |
| 11. | ආරම්භ කරන ලද නව පාඨමාලා පිලිබඳ විස්තරය | 26 |
| 12. | පුනරාවර්තන වියදම් පිලිබඳ විස්තරය | 27 |
| 13. | ප්‍රාග්ධන වියදම් පිලිබඳ විස්තරය | 27 |
| 14. | ව්‍යාපෘති පිලිබද විස්තර (දේශීය අරමුදල්) | 27 |
| 15. | ව්‍යාපෘති වියදම් පිලිබඳ විස්තරය (දේශීය අරමුදල් රු.මිලියන) | 28 |
| 16. | මූල්‍ය කාර්ය සාධනය පිලිබද විස්තරය (වැය) | 29 |
| 17. | මූල්‍ය කාර්ය සාධනය පිලිබද විස්තරය (ඉපයූ ආදායම) | 30 |
| 18. | මූල්‍ය කාර්ය සාධනය විශ්ලේශණය – 2011 | 30 |
| 19. | යටිතල ව්‍යුහමය පහසුකම් ලැබීම් පිලිබද විස්තරය– 2011 | 30 |
| 20. | විගණකාධිපති වාර්තාව | 31 |
| 21. | විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 31 |

**පෙරවදන**

මෙය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ 2011 වර්ෂයේ මුලය ප්‍රකාශ සමග ඉදිරිපත් කරන 16 වැනි වාර්ෂික වාර්තාවයි. 1985 අංක 07 දරණ විශ්ව විද්‍යාල පනතින් සංශෝධිත, 1978 අංක 19 දරණ විශ්ව විද්‍යාල පනතට අනුව ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාට පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීම පිණිස, මහා භාණ්ඩාගාරය වෙත විශ්ව විද්‍යාල පාලක සභාවේ අනුමැතිය සහ නිර්දේශය සහිතව වර්ෂය තුලදී ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් පිළිබඳ සමස්ථ ගණන් දීමක් උදෙසා භාෂා ත්‍රිත්වයෙන්ම සකසා ඉදිරිපත් කරන ලදි. එමෙන්ම, මෙම වාර්තාවේ පිටපතක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහාද ඉදිරිපත් කල යුතුව ඇත. මෙම වාර්තාවේ පිටපත් විමර්ශනය පිණිස, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාල පුස්තකාලයේ තැන්පත් කොට ඇත.

මෙම 2011 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අරමුණුවලට අනුකූලව එහි මාර්ගෝපදේශ සමග සහසම්බන්ධතාවක් ඇතිවන පරිදි මෙලෙස ව්‍යුහගත කර, පෙළගස්වා ඇත.

**ලේඛකාධිකාරි**

# උසස් අධ්‍යාපන අමාත්‍යංශය

**ගරු එස්.බී. දිසානායක**
**උසස් අධ්‍යාපන අමාත්‍ය**
**උසස් අධ්‍යාපන අමාත්‍යංශය**

**නන්දිමිත්‍ර ඒකනායක**
**උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය**
**උසස් අධ්‍යාපන අමාත්‍යංශය**

**සම්බන්ධය**

**නො. 18**
**වෝඩ් පෙදෙස**
**කොළඹ 07.**
www.mohe.lk

**උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ දැක්ම**

වසර **2020** වන විට ශ්‍රීi ලංකාවඋසස් අධ්‍යා,පනය පිළිබඳ විශිෂ්ටතම ජාත්‍ය න්තර මධ්‍යවස්ථානයක් බවට පත්කිරිම.

**උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ මෙහෙවර**

ප්‍රaතිඵල අරමුණු කොටගත් ප්‍රaතිපත්ති සහ ක්‍රaමෝපායන් සකස් කිරිම තුළින් ශ්‍රීව ලංකාහ අධ්‍යාwපන පද්ධතියේ ශිෂ්‍ය යන්, ක්ෂේත්‍රවය, කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පරදු දරන්නන් තෘප්තිමත් කිරිම, සහභාගීත්ව ක්‍රියාවලියක් තුළින් සාධනීය සහ කාර්යක්ෂම ආකාරයට ප්‍රතිඵල නිකුත් කිරීම, සුවිශිෂ්ඨ බුද්ධිමතුන්, වෘත්තිකයන්, පර්යේෂකයන් සහ ව්‍යෂවසායකයන් නිර්මාණය කිරිම සහ ශ්‍රී, ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත්කිරිම සඳහා නව්‍යය විසඳුම් ලබා දීම.

**අරමුණු**

01 උසස් අධ්‍යාපනය වෙත ප්‍රවේශය සහ අවස්ථා වැඩි කිරීම

02 සියළුම උසස් අධ්‍යාපන ආයතනවල ලෝක ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම

03 රැකියාවක නිරත විය හැකි බව වැඩි දියුණු කිරීම

04 පාර්ශවකරුවන්ගේ තෘප්තිය වැඩි කිරීම

05 උසස් අධ්‍යාපන ආයතනයන්ගේ ගෝලීය අනුකලතාව වැඩි කිරීම

06 පර්යේෂණ සහ ප්‍රකාශන පිළිබඳ විශිෂ්ඨත්වය

07 ගෝලීය සබඳතා සහ හුවමාරු වැඩි දියුණු කිරීම

08 භාණ්ඩාගාරය මත යැපෙන ස්වභාවය අඩු කිරීම

09 උපාධිධාරීන්ගේ ව්‍යවසායකත්වය වැඩි කිරීම

10 උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සාධනීයභාවය සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම

11 ජාතික සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ දිගුකාලීන දැක්ම කෙරෙහි දායක වීම

12 ජාතික ප්‍රතිසංධානය සහ ගෝලීය සාමය වෙත දායක වීම

# විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව


**මහාචාර්ය එස්.වී.ඩී.ජී. සමරනායක**
සභාපති
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**මහාචාර්ය රංජිත් සේනාරත්න**
උපසභාපති
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**තිස්ස නන්දසේන මයා**
ලේකම්
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**සම්බන්ධය**
නො 20
වෝඩ් පෙදෙස
කොළඹ 07

www.ugc.ac.lk.


**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම**

සමස්ථ ලෝක ප්‍රවනතාවන් හා යමින් ජාතියේ අවශ්‍යතාවයන් සහ අපේක්ෂාවන්ට උචිත වන ආකාරයේ උසස්ම තත්ත්වයේ විශ්ව විද්‍යාල පද්ධතියක් ගොඩනැගීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම වේ.

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවර**

උසස් අධ්‍යාපනය සමබන්ධ උනන්දුවක් දක්වන පාර්ශව සමග සම්බන්ධ වී, අධ්‍යයන පාඨමාලාවන්ගේ විවිධාංගිකරණය සහ එහි ගුණාත්මකභාවය සහතික කිරීම සහ ප්‍රශස්ත මට්ටමේ ඉගැන්වීමේ සහ පර්යේෂණ මධ්‍යස්ථාන බිහිකිරීම, උසස් මට්ටමේ ඉගෙනුමක් වෘත්තියමය පුහුණුවක් සහ පර්යේෂණ මට්ටමක් ඇති, මහජනයාට වගකිව හැකි ආකාරයේ, පුළුල් ප්‍රවේශයක් ඇති විශ්ව විදනල පද්ධතියක් අවශ්‍ය සම්පත් වෙන් කිරීම තුලින් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවරයි.

# ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය

**ආචාර්ය එස්. එම්. මොහොමඩ් ඉස්මයිල්**
**උපකුලපති**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය**

**එච්. අබ්දුල් සත්තාර් මයා**
**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය**

**සම්බන්ධය**

තැ.පෙ. 01
විශ්ව විද්‍යාල උයන
ඔලුවිල් 32360
දුරකථන (පොදු) 494 67 225506264
ෆැක්ස් (පොදු) 494 67 2255217
www.seu.ac.lk

## දැක්ම

දකුණු ආසියාවේ ජාත්‍යන්තරව පිළිගත් දැනුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

## මෙහෙවර

ඉහළ රැකියා ලාභිත්වයෙන් යුතු විවිධ ක්ෂේත්‍රයන්හි උපාධිධාරීන් බිහි කිරීම,නව දැනුම ජනනය හා බෙදා හැරීම,නම්‍යශීලී අධ්‍යාපනයට පුළුල් අවස්ථා ලබා දීම,කාර්යක්ෂම කළමණාකරණ පද්ධතියක් ක්‍රියාවට නැංවීම හා සුසංවාදී,පැහැදුනු පරදු දරන්නන්නේ යුතු සමාජයක් බිහි කිරීම තුළින් කලාපීය දැනුම හා නව්‍යකරණ ප්‍රසාරවන මධ්‍යස්ථානයක් වීම මගින් දකුණු ආසියාවේ ජාත්‍යන්තරව පිළිගත් දැනුම බෙදා හරින මධ්‍යස්ථානයක් බවට පත්වීම.

# පරමාර්ථ

පරිසරය පිළිබඳ පුළුල් විශ්ලේශණයකින් විශ්ව විද්‍යාලය විසින් පහත සඳහන් පරමාර්ථ හඳුනා ගන්නා ලදි.

1. විශ්ව විද්‍යාල අධ්‍යාපනය තුළ දේශියව හා විදේශියව පිළිගත් විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය බවට විශ්ව විද්‍යාලය පත් කිරීම.

2. පර්යේෂණ,නවෝත්පාදන, ව්‍යවසායකත්වය,යන ක්‍ෂත්‍රයන්ගේ කේන්ද්‍රස්ථානය ලෙස සම්භාවනය ලබා ගැනීම.

3. ප්‍රාදේශිය, ජාතික අවශ්‍යතාවයන්ට සහ වෙළඳපොල අපේක්ෂණයන්ට අනුකූල වන පරිදි අධ්‍යාපනයක් ලබා දෙන පිළිගත් විශ්ව විද්‍යාලයක් බවට පත් වීම.

4. සියළුම ක්‍රියාකාරකම් වලින් විශිෂ්ටත්වයක් ලඟා කර ගැනීම පිණිස විශ්ව විද්‍යාල පරිසරය සමාජියව,භෞතිකව,මෙන්ම බුද්ධිමත් බවින් උසස් තත්වයකට පත් කිරීම.

5. කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා තෘප්තිමත්,දක්ෂ,අභිප්‍රේරිත අභ්‍යන්තර හා භාහිර පාර්ශවයන් නිර්මාණය කිරීම.

6. රජ්‍යය සහ කර්මාන්ත සඳහා උපදෙස් සපයන කලාපයේ දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත් වීම.

7. පරිපාලන සහ මූල්‍ය කළමණාකරන පද්ධති වැඩි දියුණු කිරීම සහ සංයුක්ත සැලැස්ම කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම තුලින් වඩාත් හොඳ යහ පාලනයක් ඇති කිරීම.

## 1. උපකුලපතිවරයාගේ සමාලෝචනය

### a. කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවේ 10 වැනි විශ්ව විද්‍යාලය ලෙස 1995 වර්ෂයේදී ස්ථාපනය කරන ලදි.ප්‍රධාන විශ්ව විද්‍යාලය ඔලුවිල් ගම්මානයේ අක්කර 230 ක් වූ භූමි ප්‍රදේශයක පිහිටුවා ඇති අතර ව්‍යවහාරික විද්‍යා පීඨය සමන්තුරේ අක්කර 40ක් වූ භූමි ප්‍රදේශයක පිහිටුවා තිබේ. මේ වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය ඉතා කෙටි කාලයක් තුල අති විශාල ප්‍රගතියක් පෙන්නුම් කරමින් සිටි. ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්ගේත්, රජයේ සහ පෞද්ගලික අංශයේත් රැකියා ඉල්ලුමට සරිලන ලෙස අධ්‍යයන විශිෂ්ටත්වයකින් යුත් උපාධිධාරින් බිහි කිරීම සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය ප්‍රබල ලෙස යොමු වී ඇත. විශ්ව විද්‍යාලය තුල පවත්නා බහුවිධ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමට සහ අභ්‍යන්තර,බාහිර පාර්ශවයන්ගේ මෙන්ම සමාජ සමූහයන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා විශ්ව විද්‍යාලය ප්‍රයත්න දරමින් සිටි.ප්‍රදේශයේ සාමය සහ සුහදත්වය ස්ථාපනය කිරීම සඳහා විශ්ව විද්‍යාලය අති විශාල දායකත්වයක් සපයයි.

### ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ පවතින අධ්‍යයන පාඨමාලාවන්

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය සතුව කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය, ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, සහ ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය වශයෙන් පීඨ හතරක් පවතින අතර පහත සඳහන් අධ්‍යයන දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ.

| **පීඨය** | **දෙපාර්තමේන්තු** |
|---|---|
| ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය | සමාජ විද්‍යාව, භාෂා,භූගෝල විද්‍යාව |
| කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය | මූල්‍ය හා ගණකාධිකරණය, කළමණාකරනය, MIT ඒකකය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ජීව විද්‍යාව , ගණිතය සහ භෞතික විද්‍යාව |
| ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය | ඉස්ලාමීය අධ්‍යයනය, අරාබි භාෂාව |

### ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවන්

| | |
|---|---|
| උපාධි අපේක්ෂක පාඨමාලා | BBA,B.Com, BSc. in MIT, BA, B.Sc, |
| උපාධි අපේක්ෂක අධ්‍යයන ක්ෂේත්‍ර | උපාධි අපේක්ෂකයින් 20 අධ්‍යයන ක්ෂේත්‍ර |
| භාහිර උපාධි සහ වෘත්තීය පාඨමාලා | උපාධි/ඩිප්ලෝමා/සහතිකපත්‍ර/පුහුණු පාඨමාලා |

## පශ්චාත් උපාධි අධ්‍යයනය

කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය මගින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සහ කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ප්‍රධානය කරනු ලබයි. එමගින් උසස් අධ්‍යාපනය සඳහා මහජනතාව තුල පවත්නා වූ අවශ්‍යතාවයන් ලඟා කර ගැනීමට හැකි වේ.

## ආරම්භ කිරීමට නියමිත නවතම පාඨමාලාවන්

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය විසින් ව්‍යවසායකත්වය,ජාත්‍යන්තර වෙළඳාම,ආගන්තුක සත්කාරය සහ සංචාරක කර්මාන්තය,කාර්මික ගණිතය,හෙද සේවය,පරිපූරක වෛද්‍ය විද්‍යාව,අධ්‍යාපනය,යන උපාධි පාඨමාලා සහ M.A, M.Phil,M.Sc. යන පශ්චාත් උපාධි පාඨමාලා නුදුරු අනාගතයේදි ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටි.

## අධ්‍යයන ගුණාත්වයේ අඛණ්ඩ සංවර්ධනය

- ආයතනික සමාලෝචනයන් සහ විෂයයන් සමාලෝචනයන් සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලය සාර්ථක වි සිටි.
- ප්‍රාදේශිය,ජාතික සහ ගෝලිය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි විෂය පථය නවීකරණය කිරීම.
- විශ්ව විද්‍යාලය තුල අධ්‍යයන පර්යේෂණ සංස්කෘතිය වර්ධනය කිරීම සඳහා පහත පියවරයන් ගෙන තිබේ.
    - ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය සැම වර්ෂයකදිම ජාත්‍යන්තර සම්මේලන පවත්වනු ලබන අතර අධ්‍යයන කාර්යමණ්ඩලය විවිධ වූ පර්යේෂණයන් මගින් ප්‍රාදේශිය සහ ජාතික සංවර්ධනය සඳහා දායකත්වය සපයයි.
    - විශ්ව විද්‍යාලය මගින් කළමණාකරණය හා සම්බන්ධ සඟරා සහ අනෙකුත් ප්‍රකාශනයන් නිකුත් කරනු ලබයි.
    - පර්යේෂණ සංස්කෘතිය වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා තිබේ.
    - සහයෝගි පර්යේෂණයන් සඳහා විදේශිය විශ්ව විද්‍යාල හා කර්මාන්ත සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබේ.
    - පර්යේෂණයන්ගේ සහ ප්‍රකාශනයන්ගේ ගුණාත්වය වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රකාශකයන් සමග සම්බන්ධ වි සිටි.

- අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආචාර්ය උපාධි අතර අනුපාතය.මේ වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් 25% ක් පමණ ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇත.වර්ෂ 2015 වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් 50% ක් පමණ ආචාර්ය උපාධිය සම්පූර්ණ කරනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ සඳහා නිසි වෘත්තිය සංවර්ධන සැලැස්මක් සකස් කරමින් පවති.
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගිතාවයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍යය පුහුණු වීම් සපයයි.
- පර්යේෂණ, පුහුණු කිරීම් හා සංවර්ධනයන් සඳහා විදේශිය විශ්ව විද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබේ. (එක්සත් රාජ්‍යය, චීනය, මැලේසියාව සහ ඉන්දියාව)

## ජගත් ශ්‍රේණිගත කිරීම

- විශ්ව විද්‍යාල ජගත් ශ්‍රේණිගත කිරීම් තුල ඉදිරියට පැමිණීම සඳහා අවශ්‍යය පියවරයන් ගනිමින් පවතින අතර මේ සඳහා විශ්ව විද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුලත්ව විශේෂ ක්‍රියාකාරී කමිටුවක් ස්ථාපනය කර ඇත.භාහිර විශේෂඥයින් සමඟ සම්බන්ධතා පවත්වමින් වර්ෂ 2014 වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය ජගත් ශ්‍රේණිගත කිරීමට අනුව හොඳම විශ්ව විද්‍යාල 8000 අතරටත්,2015 වන විට ජාල න්‍යාසයේ 3000 අතරට සහ 2015 වන විට ජගත් ශ්‍රේණිගත කිරීමට අනුව දකුණු ආසියාවේ හොඳම විශ්ව විද්‍යාල 55 අතරටත් ගෙන ඒම සඳහා කටයුතු කරමින් පවති.
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥයින් වෙත දැනුවත් කිරීමේ පාඨමාලා සහ පුහුණු පාඨමාලා පවත්වා ඇත.

## උපාධිධාරීන් සහ ව්‍යවසායකත්ව සංස්කෘතිය

- ආයතනගත රැකියා සහ ව්‍යාපාර ගම්මානයක් ඇති කිරීම සඳහා විශ්ව විද්‍යාලය පියවර ගනිමින් සිටියි.මෙම සංකල්පය තුලින් සිසුන්ට ඔවුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසෙන අතර අධ්‍යයන කටයුතු වල නිරත වන අතරතුර උපයා ගැනීම් සඳහා අවස්ථාව සැලසෙයි.ලෝකය සමඟ වැඩ කිරීමේ අත්දැකීම ලබා ගැනීමට සිසුන්ට හැකිවන අතර සිසුන්ට ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අභිප්‍රේරණයන් සපයනු ලබයි.
- ව්‍යවසායකත්ව සංස්කෘතිය කෙරෙහි පෙළඹවීම සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය විසින් පහත සඳහන් උපාය මාර්ග ගෙන තිබේ.

    - ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය තරුණ ව්‍යවසායකත්ව සංගමයක් පිහිටුවා ඇති අතර එමගින් ව්‍යාපාර ආයතන 3 ක් පිහිටුවනු ලැබේ. වර්ෂ 2015 වන විට ව්‍යාපාර ආයතන 10 ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබේ.පසු කාලීනනව සිසුන්ට ඔවුන්ගේ උපාධි ප්‍රදානෝත්සවයෙන් අනතුරුව ඔවුන්ගේ ව්‍යාපාර ආයතන ලෙස අඛණ්ඩව පවත්වාගෙන යා හැකි අතර රැකියා ලබාදෙන්නන් බවට ද පත් විය හැකි වේ.
    - සියළුම අධ්‍යයන පාඨමාලාවන්හි විෂය පථය සඳහා ව්‍යවසායකත්ව කුසලතා විෂයයක් ලෙස ඇතුලත් කර තිබේ.
    - ව්‍යාපාරික අවස්ථාවන් ලඟා කර ගත හැකි ව්‍යාපෘතීන් සිසුන් අත්පත් කර ගනී.

## ජනවාර්ගික සංගතිය

- සියළුම සිසුන් සඳහා විෂයක් ලෙස ජනවාර්ගික සංගතිය හඳුන්වා දී තිබේ.සිංහල භාෂාව කථාකරන සිසුන් සඳහා දෙමළ භාෂාව ද, දෙමළ භාෂාව කථාකරන සිසුන් සඳහා සිංහල භාෂාව ද, ඉගැන්වීම් කරනු ලබයි.
- ප්‍රාදේශීය අනන්‍යතාවය පිළිඹිබු කිරීම සඳහා සෑම මසකම සංස්කෘතික දිනයක් සංවිධානය කරනු ලබයි.
- විශ්ව විද්‍යාල ප්‍රජාව අතර ජනවාර්ගික එකමුතුකම වැඩිදියුණු කිරීම සඳහා සංස්කෘතික අංගයන් සංවිධානය කරනු ලබයි.
- සියළුම ජනවර්ග අතර සාමාජීය එකමුතුකම වර්ධනය කිරීම සඳහා බෞද්ධ ආගමික සිසුන් සඳහා බුදුමැදුරක් ද, හින්දු ආගමික සිසුන් සඳහා දේවස්ථානයක් ද, ඉදි කිරීමට විශ්ව විද්‍යාල භූමිය තුල ඉඩ ප්‍රමාණයන් වෙන් කරන ලදි.

## පුස්තකාලය

- අධ්‍යයන පරිසරයක් ඇති කිරීම පුස්තකාලයේ ප්‍රධාන භූමිකාව වේ. විශ්ව විද්‍යාලයීය සිසුන්ගේ හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අධ්‍යයන පාඨමාලාවන් හි විශිෂ්ටත්වය තහවුරු කිරීම සඳහා පුස්තකාලය මහඟු සේවයක් ඉටු කරයි.
- විවිධ වූ අංශයන්ගෙන් සමන්විත 85000 ක පමණ පොත් එකතුවක් පුස්තකාලය සතු වේ.පාරිභෝගිකයා ඉලක්ක කර ගත් ගුණාත්මක තොරතුරු,සේවා,වැඩසටහන්,වෙනස්වන

තොරතුරු අවශ්‍යතාවයන්ට නිර්මාණශීලිව හුරු වීම සහ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් වන නව අභියෝග සඳහා නවීනතම ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍යය දැනුම පුස්තකාලය මඟින් බෙදා හරිනු ලබයි.

## කළමණාකරන පද්ධතිය වැඩි දියුණු කිරිම

කළමණාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව,සවගදායිත්වය,වගදායිත්වය,වැඩි දියුණු කිරිම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ.

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය විසින් පීඨ සංවර්ධන සැලසුම,සංයුක්ත සැලසුම,ප්‍රධාන සැලසුම පිළියෙල කර තිබේ.
- සැලසුම් වැඩි දියුණු කිරිම සහ පසු විපරම් කිරිම සඳහා විශ්ව විද්‍යාලය තුල "මෙහෙවර කාර්යාලය" (Mission Office )ස්ථාපනය කර තිබේ.
- බොහෝ පරිපාලන අංග සඳහා පරිගණකගත පද්ධති හඳුන්වා දී තිබේ.
- අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වගදායිතාව වර්ධනය කිරිම සඳහා විශ්ව විද්‍යාලය මඟින් වැඩ සටහන් සංවිධානය කර තිබේ.
- සියළුම සේවකයින් සඳහා වඩා හොඳ සංවර්ධක වැඩ පරිසරයක් නිර්මාණනය කර තිබේ.
- පරිපාලන නිලධාරින් සහ අනෙකුත් සේවකයන් අතර සුහද සම්බන්ධතාවක් පවත්වාගෙන යයි.
- විශ්ව විද්‍යාලයීය නිශ්චිත ප්‍රදේශයන් සඳහා CCTV පාලන පද්ධති ක්‍රියාත්මක කර තිබේ.
- ඇඟිලි සළකුණ පදනම් කර ගනිමින් පැමිනීම සටහන් කිරීමේ ක්‍රමය අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සහ පරිපාලන නිලධාරින් සඳහා ක්‍රියාත්මක කිරයි.

## නාගරික ව්‍යාපෘති

- දිවා සුරකුම් මධ්‍යස්ථානය සහ ළමා උද්‍යානය සඳහා වු ගොඩනැගිලි සංකීර්ණය
- මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරිම. (කෙරෙමින් පවති)
- කලියෝඩ ගඟෙහි ඉවුරු ඛාදනය වැලැක්වීම.(කෙරෙමින් පවති)
- බහුභාණ්ඩ අලෙවි සැල සඳහා වු ගොඩනැගිලි සංකීර්ණය.
- එළිමහන් රංග පීඨය,රැස්වීමේ චතුරස්‍රය,පුහුණු මධ්‍යස්ථාන,ඖෂධ උයන,මින් මැදුර, විශ්ව විද්‍යාල උද්‍යානය,ආදි යටිතල පහසුකම් වර්ධනය කිරිම.

## විනෝදාස්වාදය සහ ශිෂ්‍යය ජිවිතය

- අධ්‍යයන කටයුතු සඳහා ඇල්ම ඇතිවෙන ආකාරයෙන් ද,සමාජිය හා විවේකී ක්‍රියාකාරකම් සඳහා ගැලපෙන ආකාරයෙන් ද අධ්‍යන ක්‍රම ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය ආරම්භ කර ඇති අතර එමඟින් සිසුන්ට පුද්ගලික සංවර්ධනය වැඩි දියුණු කර ගැනිමටත්,විනෝදාස්වාදය ලබා ගැනිමටත් හැකියාව ලැබේ.
- සිසුන් විවිධ වු බාහිර ක්‍රියාකාරකම් වලින් කුසලතා පෙන්නුම් කරන අතර මේ වන විට පාපන්දු,මලල ක්‍රිඩා සහ විවිධ ක්‍රිඩා වලින් රන් පදක්කම් 68 ක් රිදී පදක්කම් 65 ක් සහ ලෝකඩ පදක්කම් 100 ක් ද ලබා ගැනීමට සිසුන් සමත් වී ඇත.
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද TALENT වැඩසටහන සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය සිසුන් දක්ෂ ලෙස සහභාගි වේ.

## ශිෂ්‍යය සුබසාධන සේවා

- ශිෂ්‍යය සුබසාධන සේවා අංශය මධ්‍යගත ඒකකයක් වන අතර එමගින් සිසුන්ගේ මැසිවිලි පාලනය සහ විසඳුම් සැපයීම,සහන සඳහා යොමු කිරීම ආදි සේවා සපයයි.එසේම විවිධ වූ සේවා අංශයන් අතර පාලනය,සමායෝජනය,සහ ඒකාබද්ධතාවය පවත්වා ගනිමින් විශ්ව විද්‍යාලය බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට සහාය වෙයි.
- ශිෂ්‍යය නේවාසිකාගාරය යන සාම්ප්‍රදායික නාමය නව ආරයට ගැලපෙන ලෙස " මිතුරු නිවහන" ලෙස වෙනස් කරන ලදි.

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය විශිෂ්ට ක්‍රියාකාරකම්

- විශ්ව විද්‍යාලයීය සිසුන් ලේ දන්දීමේ ව්‍යාපාර,ශ්‍රමදාන,ආදි සමාජ ක්‍රියාකාරකම් වල නිරතවන අතර විවිධ වූ සමාජ සේවා කටයුතු හා සමාජ සංවර්ධනය සඳහා වැඩමුළු හා දේශන පවත්වයි.
- සිසුන් සමාජ විරෝධි ක්‍රියාකාරකම් වලින් සහ බාධාකිරීම් වලින් තොරවූ පරිසරයක් බිහි කිරීම.
- විශ්ව විද්‍යාලය තුල සාමකාමි වාතාවරනයක් පවත්වා ගෙන යයි.පසුගිය කාලපරිච්ඡේදය තුල සිසුන්ගේ ගැටුම් සහ බාධා කිරීම් නොතිබුණ අතර සිසුන් විශ්ව විද්‍යාලයීය සංවර්ධනය සඳහා දායක වන ලදි.
- වෘත්තිය සමිති ක්‍රියාමාර්ග අතරතුරදි ද විශ්ව විද්‍යාල ප්‍රජාවගේ සහයෝගයෙන් විශ්ව විද්‍යාලය බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වන ලදි.
- සංවර්ධක බහු ආගමික පරිසරයක් සහ ප්‍රජාව අතර ජනවාර්ගික සංගතිය නිර්මාණය කර තිබේ.මේ නිසා විශ්ව විද්‍යාලයීය හරස් සංස්කෘතික සංකලනය ඉතා උසස් මට්ටමක පවති.
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය විදේශයන් සමඟ සම්බන්ධතා පවත්වන අතර එමගින් විශ්ව විද්‍යාලයීය අධ්‍යයන කටයුතු වල නිරත වීම සඳහා විදේශිය ස්වේච්ඡා දායකයින්ගේ සේවය ලබා ගන්නා ලදි.
- විශ්ව විද්‍යාලය පිරිසිදු සහ හරිතවත් පරිසරයක් පවත්වාගෙන යන අතර මෙය සාමකාමි අධ්‍යයන වාතාවරනයක් සඳහා මඟ පෙන්වයි.

## අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ගේ තෘප්තිමත්භාවය

- විශ්ව විද්‍යාලය කාර්යක්ෂමව,සඵලදායීව හා අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහ රැකියාගත උපාධිධාරීන් සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර හා බාහිර පාර්ශවයන් විශ්ව විද්‍යාලය කෙරෙහි තෘප්තිමත්ව මෙන්ම විශ්වාසය රඳවා ගෙන තිබේ. බාහිර සහ අභ්‍යන්තර පාර්ශවයන්ගේ තෘප්තිමත්භාවය මැනීම සඳහා සෑම වසරකම විධිමත් සමීක්ෂණයක් පැවැත්වීමට සහ බාහිර ප්‍රජාව විශ්ව විද්‍යාලය කෙරෙහි වූ තෘප්තිමත්භාවය ඉහල මට්ටමකින් පවත්වා ගැනීමට අවශ්‍යය උපායමාර්ගයන් ගනු ලැබේ.

## අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ගේ තෘප්තිමත්භාවය සඳහා විශේෂ ව්‍යාපෘති

ස්වයං මූල්‍ය පදනම යටතේ සංචාරක කර්මාන්තය සහ තොරතුරු තාක්ෂණය යන උපාධි පාඨමාලා හැදෑරීමට තුර්කිය,චීනය යන රටවලින් විදේශිය සිසුන් බඳවා ගැනීම සඳහා දේශිය නියෝජිතයන් සමඟ සාකච්ඡා කරමින් සිටි.මේ නිසා වීසා ක්‍රියාවලිය,පාඨමාලා ගාස්තු,ඇතුලත්වීමේ කොන්දේසි, යනාදිය පිළිබඳව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පැහැදිලි උපදෙස් අවශ්‍යය වේ.

විශ්ව විද්‍යාලයීය දුරස්ථ පාඨමාලා සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම, විදේශිය ශිෂ්‍යත්ව ලාභීන් සහ සිසුන් සඳහා නේවාසික පහසුකම් සංවර්ධනයට අක්කර 20ක් පමණ වූ භූමියක් ඉඩම් කොමසාරිස් විසින් නිදහස් කරන ලදි. ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් මත මෙය තවමත් විශ්ව විද්‍යාලයට ලබා දි නොමැත.නමුත් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍යය ප්‍රධාන සැලසුම සකස් කර තිබේ.

## විශ්ව විද්‍යාල පාලක සභාව

විශ්ව විද්‍යාල පාලක සභාව, විශ්ව විද්‍යාලයේ ප්‍රධාන විධායක මණ්ඩලය මෙන්ම පාලන අධිකාරියද වන අතර විශ්ව විද්‍යාල පනතින් පවරන ලද බලයට අනුව උපකුලපතිවරයා පාලක සභාවේ සභාපතිවරයා වේ. මෙය, සනාථන සභාවෙන් සහ පීඨ මණ්ඩල වලින් ඉදිරිපත් කරන ලද යෝජනා අනුමත කිරීමේ අවසාන අධිකාරිය වේ. මුදල් කමිටුව, ඉඩම්, ගොඩනැගිලි සහ නඩත්තු කමිටුව,විගණන කමිටුව, ටෙන්ඩර් මණ්ඩලය සහ තේරීම් කමිටුව යන අනුකාරක කමිටු වලින් පාලක සභාව සමන්විත වේ. විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා, පාලක මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

**නිලබලයෙන් පත්කල සාමාජිකයෝ**

ආචාර්ය එස්.එම්.මොහොමඩ් ඉස්මයිල් - උපකුලපති (සභාපති)

ආචාර්ය එම්. අයි. එස්. සෆීනා මිය - පීඨාධිපති/ ව්‍යවහාරික විද්‍යා පීඨය

එස්. එම්. අලිෆ් මයා (22.08.2011දක්වා) - පීඨාධිපති/ ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය

කේ. එම්.එම්.ෆලීල් හක් මයා (23.08.2011සිට) - පීඨාධිපති/ ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය

එම්. එස්. එම්. ජලාල්ඩීන් මයා (13.11.2011 දක්වා) - පීඨාධිපති/ ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය

ඒ.බී. එම්.අලියාර් මයා (30.11.2011 සිට) - පීඨාධිපති/ ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය

එම්. බී. එම්. අම්ජාත් මයා - පීඨාධිපති/ කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය

**වරණිත බාහිර සාමාජිකයෝ**

මහාචාර්ය දයාන්ත විජේසේකර

වෛද්‍ය පී.කේ.සී.එල්. ජයසිංහ මයා

පී.ටී.ඒ. හසන් මයා (07.07.2011 දක්වා)

වයි. එම්. අන්වර් සියාද් මයා (07.07.2011 දක්වා)

ආචාර්ය එෆ්. එස්. එල්. රියාස් (07.07.2011 දක්වා)

එල්. ආර්. එස්. බණ්ඩාර මයා (07.07.2011 දක්වා)

එම්. එම්. අබ්දුල් කලාම් මයා (07.07.2011 දක්වා)

අන්වර් එම්. මුස්තාෆා මයා (07.07.2011 දක්වා)

මහාචාර්ය.ඒ සන්මුගදාස් (22.07.2011සිට)

එන්. එම් ෂහීඩ් මයා (22.07.2011 සිට)

කේ. එම්.එච්. අක්බර් මයා (22.07.2011 සිට)

එම් ටි. එච්. එම් ෂහිඩ් මයා (22.07.2011 සිට)

ඒ. එල් බදුරුදීන් මයා (22.07.2011 සිට)

එම් එන්. එම් නෆීල් මයා (22.07.2011 සිට)

**සනාථන සභාව විසින් නම් කල සාමාජිකයෝ**

ආචාර්ය එෆ්. සී. රගෙල්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය, ව්‍යවහාරික විද්‍යා පීඨය(27.05.2011 දක්වා)

ආචාර්ය ඒ. ජෆ්ෆර්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, II ශ්‍රේණිය, කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය (01.12.2011 දක්වා)

ආචාර්ය එම්.අයි.එම්. කලිල්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය (23.06.2011සිට)

ආචාර්ය. ආර්.සෙන්දිල්නිදි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යවහාරික විද්‍යා පීඨය (23.11.2011සිට)

**<u>ලේකම්</u>**

එච්. අබ්දුල් සත්තාර් මයා, ලේඛකාධිකාරී

## <u>විශ්ව විද්‍යාල සනාථන සභාව</u>

සනාථන සභාව, විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් අධිකාරිබලය ඇති ඒකකය වේ. වඩා හොඳ අධ්‍යයන ප්‍රතිඵල සඳහා විශ්ව විද්‍යාලීය ප්‍රජාවට සහ මහජනයාට වග කියන, පනතින් බලය පවරන ලද පීඨ, දෙපාර්තමේන්තු සහ ඒකක ඔස්සේ විශ්ව විද්‍යාලයේ ඉගැන්වීමේ, ඉගෙනීමේ, පර්යේෂණ, විෂයමාලා සැලසුම් කිරීම සහ විභාග ක්‍රියා පිළිවෙල පාලනය කිරීම සහ මග පෙන්වීම කරනු ලබයි. පීඨයන් විසින් පාලක සභාව වෙත අවසාන අනුමැතිය සඳහා ඉදිරිපත් කරන යෝජනා අනුමත කිරීම සහ නිර්දේශ කිරීම සනාථන සභාව විසින් කරනු ලබයි. පුස්තකාල කමිටුව, අධ්‍යයන නිවාඩු පිරිනැමීමේ කමිටුව, සිසුන් ඇතුලත් කර ගැනීමේ කමිටුව, පර්යේෂණ සහ ප්‍රකාශණ කමිටුව සහ විෂයමාලා සහ ඇගැයීමේ කමිටුව යන අනු කමිටු වලින් විශ්ව විද්‍යාල සනාථන සභාව සමන්විත වේ. විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා, සනාථන සභාවේ ලේකම්කරයා වශයෙන් කටයුතු කරයි.

**නිලබලයෙන් පත් කරන ලද සාමාජිකයෝ**

| | |
|---|---|
| ආචාර්ය එස්.එම්.මොහොමඩ් ඉස්මයිල් | - උපකුලපති |
| ආචාර්ය එම්. අයි. එස්. සෆීනා මිය | - පීඨාධිපති/ ව්‍යවහාරික විද්‍යා පීඨය |
| එස්. එම්. අලිෆ් මයා | - පීඨාධිපති/ ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය (22.08.2011දක්වා) |
| කේ. එම්.එම්.ෆලීල් හක් මයා | - පීඨාධිපති/ ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය (23.08.2011 දක්වා) |
| එම්. එස්. එම්. ජලාල්ඩීන් මයා | - පීඨාධිපති/ ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය (13.11.2011සිට) |
| ඒ.බී. එම්.අලියාර් මයා | - පීඨාධිපති/ ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය (30.11.2011 සිට) |
| එම්. බී. එම්. අම්ජාත් මයා | - පීඨාධිපති / කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය |

ආචාර්ය ඒ. ජහ්ෆර්. මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි/ගණකාධිකරණ සහ මූල්‍ය දෙපාර්තමේන්තුව

ඒ.බී. එම්.අලියාර් මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / අරාබි භාෂා දෙපාර්තමේන්තුව (29.11.2011 දක්වා)

එම් .එච්.ඒ.මුනාස් මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / අරාබි භාෂා දෙපාර්තමේන්තුව (30.11.2011 සිට)

ඒ.එම්.ජේ.එම්. රිස්වි මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි/ ජීව විද්‍යා දෙපාර්තමේන්තුව

එම්.එල්.ෆවුසුල් අමීර් මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව (01.08.2011 සිට)

එස්. එම්. එම්. මසාහිර් මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / ඉස්ලාමිය අධ්‍යයන දෙපාර්තමේන්තුව (10.03.2011 දක්වා)

ආචාර්ය. එම්.අයි. එම්. ජසීල් - දෙපාර්තමේන්තු ප්‍රධානි / ඉස්ලාමිය අධ්‍යයන දෙපාර්තමේන්තුව

(28.03.2011 සිට)

කේ.රඝුපරන් මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / භාෂා දෙපාර්තමේන්තුව

(26.05.2011 දක්වා)

ආචාර්ය. එම්.ඒ. එම්.රමීස් - දෙපාර්තමේන්තු ප්‍රධානි / භාෂා දෙපාර්තමේන්තුව

(27.05.2011 සිට)

සරිනා යූ.එම්. ඒ.ගෆූර් මිය - දෙපාර්තමේන්තු ප්‍රධානි / කළමනාකරණ දෙපාර්තමේන්තුව

ආචාර්ය පී ඉලංගෝ - දෙපාර්තමේන්තු ප්‍රධානි / ගණිත විද්‍යා දෙපාර්තමේන්තුව

( 13.04.2011 දක්වා)

ආචාර්ය ඒ. ජහ්ෆර්. මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / ගණිත විද්‍යා දෙපාර්තමේන්තුව (15.05.2011 සිට)

ආචාර්ය එන්. ඩබ්ලිව්. බී. බාලසූරිය - දෙපාර්තමේන්තු ප්‍රධානි / භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව ( 17.03.2011 දක්වා)

ආචාර්ය. ආර්.සෙන්දිල්නිදි මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව (14.04.2011 සිට)

කේ. එම්.එම්.ෆලීල් හක් මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

(30.06.2011 දක්වා)

එම් .ඒ.ජබාර් මයා - දෙපාර්තමේන්තු ප්‍රධානි / සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව (19.09.2011 සිට)

<u>**වරණිත බාහිර සාමාජිකයන්**</u>

ආචාර්ය එෆ්. සී. රාගෙල් - ව්‍යවහාරික විද්‍යා පීඨය (04.03.2011 දක්වා)

ආචාර්ය. යූ.එල්.සයනුදීන් - ව්‍යවහාරික විද්‍යා පීඨය (05.03.2011 සිට)

ඒ. එන්. අහමඩ් මයා - ව්‍යවහාරික විද්‍යා පීඨය (05.03.2011 සිට)

අයි. එල්. එම්. මාහිර් මයා - ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය (24.02.2011 දක්වා)

එම්.ඒ.එස්.එෆ්.සාදියා මයා - ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය (16.08.2011 දක්වා)

ආචාර්ය. එම්.අයි.එම්. කලීල් - ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය (25.02.2011 සිට)

ආචාර්ය. ඒ .එෆ්.එම්.අෂ්රෆ් - ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය (17.08.2011 සිට)

එම්.එච්. ඒ.මුනාස් මයා - ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය (30.11.2011 දක්වා)

එම්.එච්.එම්.නයිරූස් මයා - ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය (11.04.2011 සිට)

එම්.එස්. එම්.ජලාල්ඩීන් මයා - ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය (27.12.2011 සිට)

කේ. එම්.මුබාරක් - කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය

ඒ.එම්. එම්.මුස්තාෆා - කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය

**ලේකම්**

එච්. අබ්දුල් සත්තාර් මයා, ලේඛකාධිකාරී

**b. මුදුන්පමුණුවාගැනීම් :**

i. ත්‍රිත්ව ජාතීන් අතර සමාජීය එකමුතුකම වර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා බෞද්ධ ආගමික හා හින්දු ආගමික සිසුන්ගේ ආගමික කටයුතු සඳහා අවශ්‍ය ආගමික ස්ථාන ගොඩනැගීම සඳහා විශ්ව විද්‍යාල භූමිය තුල ඉඩම් වෙන්කර ලබා දෙන ලදි.

ii. ත්‍රිත්ව ජාතීන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය සැමරීම සඳහා විශ්ව විද්‍යාලය මගින් සිසුන් දිරිමත් කරන ලදි.

iii. අනුමත ගාස්තු මත ගෙවීම් කිරීමේ පදනමින් විශ්ව විද්‍යාලයීය නේවාසිකාගාර ගොඩනැගිලි සඳහා තීන්ත ආලේප කිරීමට සිසුන්ගේ සේවාව ලබා ගන්නා ලදි.මෙහි ප්‍රතිඵලයක් ලෙස විශ්ව විද්‍යාලය දැන්වීම් පුවරු තොරවූ පරිසරයක නිදහස භුක්ති විඳියි.

iv. විශ්ව විද්‍යාලයීය සේවකයින් යොදා ගනිමින් සිසුන් 400 කට පමණ සේවා සැපයිය හැකි භෝජනාගාරයක් ඉදිකරන ලද අතර මේ සඳහා වැය වූ පිරිවැය සම්පූර්ණ ඇස්තමේන්තු ගත මුදලින් 65% පමණ වේ.මේ සඳහා වී අලෙවි මණ්ඩලයට අයත් ගොඩනැගිලි වලින් ඉවත දමන ලද ද්‍රව්‍ය ද භාවිතයට ගන්නා ලද අතර මෙය ව්‍යවහාරික විද්‍යා පීඨයේ පවතින හොඳම ගොඩනැගිලි වලින් එකක් වේ.

v. 1 වන ජාත්‍යන්තර ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය විදේශීය විද්‍යාර්ථීන්ගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථක ලෙස පැවැත්වුණි. සහභාගි වූ විදේශීය විද්‍යාර්ථීන් අතර ඉන්දියාව ප්‍රමුකස්ථානයක් ගන්නා ලදි.

vi. රජයේ ප්‍රතිපත්ති වලට අනුකූල වෙමින් කලා උපාධිධාරීන්ගේ සේවා නියුක්ති අනුපාතය ඉහල නැංවීමේ අරමුණින් පහත සඳහන් නව පාඨමාලා හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගන්නා ලදි.
   a. ත්‍රි භාෂා උපාධිය
   b. කලා උපාධිධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය
   c. ආගන්තුක සත්කාර කළමණාකරණය

vii. විශ්ව විද්‍යාල භූමි පරිශ්‍රය තුල හරිත සහ පිරිසිදු වටපිටාවක් හඳුන්වාදීම ක්‍රියාත්මක කිරීම.

viii. ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ යටිතල ව්‍යුහමය පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගිවිසුමේ දෙවන අධියර යටතේ කුවෙට් ඩිනාර් මිලියන 3 ක් අරාබි සංවර්ධනය පිළිබද කුවෙට් අරමුදල එකඟ වී ඇත.

ix. ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන්ගේ දෙමාපියන්ගේ සහභාගිත්වයෙන් සමීප අධීක්ෂණ යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරීම තුලින් නවක වදයෙන් තොර වටාපිටාවක් ඇතිකරන ලදි.

x. කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය යටතේ පශ්චාත් උපාධි ඒකකයක් පිහිටවූ අතර ව්‍යාපාර පරිපාලනය පිළිබද පශ්චාත් උපාධිය සහ ව්‍යාපාර සහ මූල්‍ය කළමනාකරණය පිළිබද පශ්චාත් උපාධිය සඳහා කණ්ඩායම් දෙකක් සාර්ථකව පවත්වාගෙන යයි.

xi. විදුලිය සැපයුම කාර්යක්ෂම කළමනාකරණය සහ පාලනය කිරීම පිණිස සාර්ථක ශක්තිය කාර්යක්ෂම සැලැස්මක් හදුන්වා දි ක්‍රියාත්මක කරන ලදි.

**c. අරමුණු මුදුන්පමුණුවාගැනිමට අපොහොසත්වීම් සහ ඊට හේතුදැක්වීම්:**

- පහත සඳහන් හේතුන් මත වත්කම් සත්‍යාපනය සම්පූර්ණ කිරීමට නොහැකි වීම.
  - ➢ දෙපාර්තමේන්තු තොග ලේඛනය යාවත්කාලීන නොකිරීම.
  - ➢ ප්‍රධාන තොග ලේඛනය යාවත්කාලීන නොකිරීම.
  - ➢ සුනාමි,ගංවතුර,ගිනි ගැනීම් වැනි ආපදාවන් හේතුවෙන් නැති වු සහ හානි වු අයිතමයන් පිළිබඳව ක්‍රියාමාර්ග නොගැනීම.

**d. අනාගත සැලසුම්**

- විශ්ව විද්‍යාලයීය සංයුක්ත සැලැස්මේ ඇතුලත් කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කිරීම.
- සිසුන් සංඛ්‍යාව 3000 දක්වා වැඩි කිරීමට විශ්ව විද්‍යාලය මගින් සැලසුම් කරනු ලැබේ.
- කුවේට් ව්‍යාපෘතියේ අදියර II ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු තාක්ෂණ පීඨයක් ස්ථාපනය කිරීම.
  - ➢ ත්‍රි භාෂා උපාධිය (UGC අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටි)
  - ➢ කලා උපාධිධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය
  - ➢ ආගන්තුක සත්කාර කළමණාකරණය

## 2. ශිෂ්‍යයන් සහ සම්පත් පිළිබඳ විස්තර:

| පීඨය | පාඨමාලාව | මුළු ශිෂ්‍යයන් | මුළු අධ්‍යයන කාර්යමණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්යමණ්ඩලය |
|---|---|---|---|---|
| **ව්‍යවහාරික විද්‍යා පීඨය** | ජීව විද්‍යා | 105 | 20 | 26 |
| | භෞතික විද්‍යා | 88 | | |
| | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 388 | 30 | 10 |
| **ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය** | ශාස්ත්‍රවේදී (විශේෂ) | 151 | | |
| **ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය** | අරාබි (සාමාන්‍ය) | 136 | 10 | 04 |
| | අරාබි (විශේෂ) | 13 | | |
| | ඉස්ලාමීය අධ්‍යයන (සාමාන්‍ය) | 179 | | |
| | ඉස්ලාමීය අධ්‍යයන (විශේෂ) | 48 | | |
| **කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය** | කළමණාකරණය | 289 | 24 | 06 |
| | වාණිජ | 138 | | |
| | කළමනාකරණ තොරතුරු තාක්‍ෂණය | 136 | | |
| | කළමනාකරණ අධ්‍යයනය සඳහා තොරතුරු තාක්‍ෂණය | 58 | | |
| **පුස්තකාලය** | | | 04 | 20 |
| **අනෙකුත් දෙපාර්තමේන්තු** | | | - | 126 |
| **එකතුව** | | | **88** | **192** |

## 3. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර :

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුලත් වීම 2011 | පළමු වසර ශිෂ්‍යයන් | දෙවන වසර ශිෂ්‍යයන් | තෙවන වසර ශිෂ්‍යයන් | අවසන් වසර ශිෂ්‍යයන් | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ජීව විද්‍යා | ඉංග්‍රීසි | 132 | 50 | 31 | 22 | 2 | 7 |
| | භෞතික විද්‍යා | ඉංග්‍රීසි | 141 | 29 | 32 | 27 | - | 8 |
| ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය | ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) | දෙමළ | 124 | 167 | 87 | 134 | - | 2 |
| | ශාස්ත්‍රවේදි (විශේෂ) | දෙමළ | - | - | 59 | 47 | 45 | - |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය | අරාබි (සාමාන්‍ය) | දෙමළ | 103 | 71 | 35 | 30 | - | - |
| | අරාබි (විශේෂ) | දෙමළ | - | - | 4 | 7 | 2 | - |
| | ඉස්ලාමීය අධ්‍යයන (සාමාන්‍ය) | දෙමළ | 156 | 84 | 51 | 44 | - | 4 |
| | ඉස්ලාමීය අධ්‍යයන (විශේෂ) | දෙමළ | - | - | 19 | 17 | 12 | - |
| කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය | කළමණාකරණය | ඉංග්‍රීසි සහ දෙමළ | 151 | 93 | 86 | 64 | 43 | 1 |
| | වාණිජ | ඉංග්‍රීසි සහ දෙමළ | 93 | 54 | 38 | 40 | 6 | - |
| | කළමනාකරණ තොරතුරු තාක්ෂණය | ඉංග්‍රීසි | 89 | 79 | 57 | - | - | - |
| | කළමනාකරණ අධ්‍යයනය සඳහා තොරතුරු තාක්ෂණය | ඉංග්‍රීසි | - | - | - | 58 | - | - |
| **එකතුව** | | | **989** | **627** | **499** | **490** | **110** | **22** |

2011 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ ඇති වූ ජලගැලීම් හේතුවෙන් දෙවන අර්ධවර්ෂයේ අධ්‍යයන කටයුතු සියළුම සිසුන් සඳහා මාස 4 කින් කල් දැමීමට සිදු වූ අතර 2011 දෙසැම්බර් මස අධ්‍යයන කටයුතු නිම කිරීමට සිටි සිසුන් 419 ට අධ්‍යයන කටයුතු නිම කිරීමට හැකි වූයේ 2012 වසරේ අප්‍රේල් මසදීය. ඉහත වගුවේ පෙන්වා ඇති උපාධිධාරීන් 22, 2011 වර්ෂය නියෝජනය කරන අතර ඔවුන් 2011 වසරේ ජුනි මස පැවති පළමු අර්ධ වර්ෂ පරීක්ෂණයට නැවත පෙනී සිට සුදුසුකම් සපුරන ලද සිසුන් වේ.

## 4. විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුලත් වීම 2011 | පළමු වසර ශිෂ්‍යයන් | දෙවන වසර ශිෂ්‍යයන් | තෙවන වසර ශිෂ්‍යයන් | අවසන් වසර ශිෂ්‍යයන් | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය | අරාබි භාෂා(විශේෂ) | දෙමළ | 01 | | | අදාළ නොවේ | | |

## 5. අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර


| පීඨය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය | කතිකාචාර්ය | සහකාර කතිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය | භූගෝල විද්‍යාව | දෙමළ | - | - | 03 | - | - | - |
| | දෙමළ | දෙමළ | - | - | 05 | - | - | - |
| | දේශපාලන විද්‍යාව | දෙමළ | - | - | 02 | 01 | - | - |
| | ආර්ථික විද්‍යාව | දෙමළ | - | - | 04 | - | - | - |
| | දර්ශන විද්‍යාව | දෙමළ | - | - | 04 | - | - | - |
| | ඉංග්‍රීසි | ඉංග්‍රීසි | - | - | - | 06 | - | - |
| | සමාජ විද්‍යාව | දෙමළ | - | - | 01 | 01 | - | - |
| | සිංහල | සිංහල | - | - | 01 | - | - | - |
| | ඉතිහාසය | දෙමළ | - | - | 01 | - | - | - |
| | පරිගණක තාක්ෂණය | දෙමළ/ ඉංග්‍රීසි | - | - | - | - | - | 04 |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය | අරාබි භාෂාව | දෙමළ | - | - | 03 | - | 03 | - |
| | ඉස්ලාමීය සංස්කෘතිය | දෙමළ | - | - | 02 | - | 01 | - |
| | ඉස්ලාමීය අධ්‍යයනය | දෙමළ | - | - | - | - | 01 | - |
| කළමනාකරණය | කළමනාකරණය | දෙමළ | - | - | 08 | - | 01 | - |
| | ගිණුම්කරණය | දෙමළ | - | - | - | - | - | - |
| | වාණිජ්‍යය | දෙමළ | - | - | 01 | 01 | - | - |
| | ව්‍යාපාර පරිපාලනය | දෙමළ | - | - | 01 | - | - | - |
| | අලෙවි කළමනාකරණය | දෙමළ | - | - | 02 | - | - | - |
| | ව්‍යාපාර ආර්ථික විද්‍යාව | දෙමළ | - | - | 01 | - | - | - |
| | ව්‍යාපාර අධ්‍යයනය | දෙමළ | - | - | 01 | - | - | - |
| | MIS | ඉංග්‍රීසි | - | - | 01 | - | - | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | MIT | ඉංග්‍රීසි | - | - | 02 | - | - | - |
| **ව්‍යවහාරික විද්‍යා පීඨය** | කෘෂිකර්මාන්තය | දෙමළ | - | - | 01 | - | - | - |
| | උද්භිද විද්‍යාව | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 02 | - | - | - |
| | පෘථිවි විද්‍යාව | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 03 | - | - | - |
| | සත්ව විද්‍යාව | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 01 | - | - | - |
| | සංඛ්‍යානය | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 02 | - | 01 | - |
| | රසායන විද්‍යාව | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 03 | - | - | - |
| | ගණිතය | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 02 | - | 01 | - |
| | භෞතික විද්‍යාව | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 02 | - | - | - |
| | පරිගණක විද්‍යාව | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 01 | - | 01 | - |
| | පෘථිවි විද්‍යාව | දෙමළ/ ඉංග්‍රීසි | - | - | - | - | - | - |
| | පරිගණක තාක්ෂණය | දෙමළ/ ඉංග්‍රීසි | - | - | - | - | - | 02 |
| **එකතුව** | | | | | **59** | **10** | **11** | **06** |

## 6. උපාධිධාරී සේවා නියුක්තිය – 2011

සෑම උපාධි ප්‍රදානෝත්සවකට ප්‍රථම උපාධිලාභීන් වෙත ප්‍රශ්නාවලියක් නිකුත් කිරීම මගින් සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු රැස්කරනු ලබයි. 2011 වසරේ උපාධි ප්‍රදානෝත්සවයේ උපාධිධාරීන් වීමට නියමිත උපාධිලාභීන්ගෙන් එක් රැස් කල තොරතුරු අනුව ඔවුන්ගේ සේවා නියුක්තිය පහත පරිදි වේ.

| පීඨය | සිසුන් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | සේවා නියුක්තිය | | ඌන සේවා නියුක්තිය | | සේවා වියුක්තිය | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ව්‍යවහාරික විද්‍යා | 32 | 56.1% | 3 | 5.3% | 22 | 38.6% |
| ශාස්ත්‍ර සහ සංස්කෘතික | 53 | 24.9% | 23 | 10.8% | 137 | 64.3% |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂාව | 19 | 27.1% | 6 | 8.6% | 45 | 64.3% |
| කළමනාකරණය හා වාණිජ | 30 | 53.6% | 4 | 7.1% | 22 | 39.3% |



## 7. අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර

| පීඨය/ අංශය | අති ජ්‍යෙෂ්ඨ | ජ්‍යෙෂ්ඨ | කණිෂ්ඨ | සුළු සේවකයන් |
|---|---|---|---|---|
| පොදු පරිපාලනය | 07 | 01 | 15 | 09 |
| මූල්‍ය පරිපාලනය | 03 | 01 | 10 | 02 |
| ගබඩා සහ සැපයුම් අංශය | 01 | - | 04 | 02 |
| වෘත්තිය මාර්ගෝපදේශ ඒකකය | - | - | 01 | 01 |
| ආරක්ෂක සේවා | 01 | - | 12 | 11 |
| ප්‍රවාහන සේවා | - | - | 01 | 09 |
| ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය | 01 | - | 04 | 06 |
| කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය | - | - | 04 | 02 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 01 | 01 | 13 | 12 |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය | - | - | 03 | 01 |
| විභාග සේවා | 01 | - | 07 | 02 |
| පුස්තකාල සේවා | - | - | 11 | 09 |
| සේවක සහ ශිෂ්‍යය සුබසාධන සේවා | - | - | 02 | 04 |
| ශාරීරික අධ්‍යාපනය | - | - | 01 | 02 |
| නඩත්තු අංශය | - | - | - | - |
| ඉඩම් සහ ගොඩනැගිලි | 01 | - | 05 | 17 |
| විදුලිය සහ ජලය සැපයුම | - | - | - | 06 |
| නේවාසිකාගාර | - | - | 02 | - |
| **එකතුව** | **16** | **03** | **95** | **95** |

ජ්‍යෙෂ්ඨතාවය මත වර්ග කරන ලද අධ්‍යයන නොවන කාර්යමණ්ඩලයේ විස්තර සංඛ්‍යාමය වශයෙන් පහත පරිදි වේ

### අති ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය :

### පොදු පරිපාලනය

| | |
|---|---|
| ලේඛකාධිකාරී | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 03 |
| සහකාර ලේඛකාධිකාරී | 02 |
| සහකාර අභ්‍යන්තර විගණක | 01 |

**මූල්‍ය පරිපාලනය**

| | |
|---|---|
| මූල්‍යාධිකාරී | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 01 |
| සහකාර මූල්‍යාධිකාරී | 01 |

**ගබඩා සහ සැපයුම් අංශය**

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 01 |

**ආරක්ෂක සේවා**

| | |
|---|---|
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 01 |

**ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය**

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 01 |

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

| | |
|---|---|
| සහකාර ලේඛකාධිකාරී | 01 |

**විභාග සේවා**

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 01 |

**නඩත්තු අංශය**

ඉඩම් ගොඩනැගිලි

| | |
|---|---|
| දේපල භාරකාරු | 01 |
| | **16** |

**ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය**

**පොදු පරිපාලනය**

| | |
|---|---|
| ලිපිකරු සේවයේ මාණ්ඩලික සහකාර | 01 |

**මූල්‍ය පරිපාලනය**

| | |
|---|---|
| පොත් තැබීමේ මාණ්ඩලික සහකාර | 01 |

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

| | |
|---|---|
| ලිපිකරු සේවයේ මාණ්ඩලික සහකාර | 01 |

**කණිෂ්ඨ කාර්යමණ්ඩලය**

ලිපිකාර සහ සමාන්තර ශ්‍රේණි 95

**සුළු සේවකයන්**

පුහුණු, නුපුහුණු, අර්ධ පුහුණු 95

**8. පර්යේෂණ, නවෝත්පාදන, ප්‍රකාශන පිලිබඳ විස්තර :**

| | විෂයය | ප්‍රකාශන | වාණිජගතකරණලද | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|---|
| a. | පර්යේෂණ සංඛ්‍යාව | 11 | - | 53 |
| b. | නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| c. | සඟරා සංඛ්‍යාව | - | - | - |
| d. | පොත් සංඛ්‍යාව | 02 | - | - |
| e. | පත්‍රිකා සංඛ්‍යාව | 11 | - | 01 |
| f. | වෙනත් | - | - | - |
| | එකතුව | **24** | **-** | **54** |

අධ්‍යන කාර්යමණ්ඩල විසින් කරන ලද පර්යේෂණ , සඟරා , පොත් සහ පත්‍රිකා පිළිබඳ විස්තර පීඨ වශයෙන් පහත පරිදි වේ

## ව්‍යවහාරික විද්‍යා පීඨය

**පර්යේෂණ පත්‍රිකා:**

**ප්‍රකාශිත:**

- ඒ.එම්.රශ්මි. (2011), ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත ව්‍යවහාරික සංඛ්‍යානය සඟරාවට *"Joint Monitoring of Process Mean and Variance with Shewhart Distance Scheme, Sri Lankan"*, නමින් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරීම.

- අචාර්ය. ඒ. ජන්ඡර් සහ සි.පියැන්බො. (2011), ස්ප්‍රින්ගර් ප්‍රකාශිත මෙට්‍රිකා සඟරාවට *"Identifying Local Influential Observations in Liu Estimator"*, නමින් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරීම.

- අචාර්ය. ඒ. ජන්ඡර් සහ සි.පියැන්බො. (2011), දත්ත විද්‍යාව සඟරාවට *"Measuring Local Influential Observations in Modified Ridge Regression"*, නමින් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරීම.

- අචාර්ය. එන්.ඩබ්.බී. බාලසූරිය. (2011), දෙසැම්බර් 13-15 දක්වා පැවති ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ගේ ලෝක සැසිය සඳහා *"Li-Ion Battery Anode uses Nano sized Sri Lanka vein graphite to enhance battery capacity"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

**ඉදිරිපත් කිරීම්:**

- ආචාර්ය. එන්.ඩබ්.බී. බාලසූරිය. (2011), ඔක්තෝබර් 3-9 දක්වා ඉතාලියේ පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයට සහභාගි වීම සහ *"Investigation of Landslides in Environmental Impact Assessment"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- ආචාර්ය. එන්.ඩබ්.බී. බාලසූරිය. (2011),පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජනවාරි මස 09-12 දක්වා පැවති සම්මන්ත්‍රණයට *"Enhancing Research Skills through Scientific Collaboration"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- ඒ.කේ. වික්‍රමසූරිය. (2011), ඔස්ට්‍රියාවේ වෙයිනා හිදි මැයි 01-05 දක්වා පැවති හයිඩ්‍රොඑකො 2011 සම්මන්ත්‍රණය සඳහා සහභාගි වීම සහ *"Tsunami and its effect on coastal and marine ecosystems of Southern and Eastern coastal zones of Sri Lanka (poster),* නමින් පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කිරීම.

- ඒ.කේ. වික්‍රමසූරිය. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා"කළමණාකරණය, තාක්ෂණය සහ විද්‍යාව මඟින් පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා *"Application of spatial technology for planning and implementation of development activities in Eastern and Northern coasts of Sri Lanka,* නමින් පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කිරීම.

- ඒ.කේ. වික්‍රමසූරිය. (2011), *Institute of fundamental Studies* මඟින් සංවිධානය කරන ලද පෙබරවාරි 25-26 දි නුවර දි පැවති "උවදුරු:අඩු කිරීම,සහ කළමණාකරණය",ජාතික සම්මන්ත්‍රණය සඳහා *"Preliminary flood risk intensity map of Southern province of Sri Lanka"*, නමින් පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කිරීම.

- ඒ.එම්.රස්මි. (2011), *"Surveillance of Chikungunya and its Impacts in the Sainthamaruthu MOH Division",* පර්යේෂණ පත්‍රිකාව ජාතික සම්මන්ත්‍රණයක් සඳහා ඉදිරිපත් කිරීම.

- ඒ.එම්.රස්මි. (2011), *"Male Participation in Family Planning",* පර්යේෂණ පත්‍රිකාව ජාතික සම්මන්ත්‍රණයක් සඳහා ඉදිරිපත් කිරීම.

- ඒ.එම්.රස්මි. (2011), *"A Study of Association between Diabetic and Job Stress",* පර්යේෂණ පත්‍රිකාව ජාතික සම්මන්ත්‍රණයක් සඳහා ඉදිරිපත් කිරීම.

- ආචාර්ය. පි.ඉලංගෝ. (2011*),"Mackey Functors on Groupoids",* පර්යේෂණ පත්‍රිකාව ජාතික සම්මන්ත්‍රණයක් සඳහා ඉදිරිපත් කිරීම.

- ආචාර්ය. පි.ඉලංගෝ. (2011*),"Global Forum of Sri Lanka on Scientist",* පර්යේෂණ පත්‍රිකාව ජාතික සම්මන්ත්‍රණයක් සඳහා ඉදිරිපත් කිරීම.

- ආචාර්ය. එම්.ඒ.සී.එම්. රාෆි. (2011)*,"Translation Keyboard Configuration with Tamil Unicode Character",* පර්යේෂණ පත්‍රිකාව ජාතික සම්මන්ත්‍රණයක් සඳහා ඉදිරිපත් කිරීම.

- ආචාර්ය. එම්.ඒ.සී.එම්. රාෆි. (2011),*"Automatic Speech Recognition System for Tamil Language",* පර්යේෂණ පත්‍රිකාව ජාතික සම්මන්ත්‍රණයක් සඳහා ඉදිරිපත් කිරීම.

- ආචාර්ය. එම්.එච්.හරූන්, එම්.අයි Choudhry සහ එච්.ආර්.ඩබ්. ධර්මරත්නම්. (2011) "කළමණාකරණය, තාක්ෂණය සහ විද්‍යාව තුලින් පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දි *"Urease inhibitory active compound from marine endophytic fungus Aspergillus terreus", උදෘත පිටු අංකය 134.*

## ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය

**පර්යේෂණ පත්‍රිකා:**

**ප්‍රකාශිත:**

- අචාර්ය. එම්. ඒ. මොහොමඩ් රමීස්. (2011), මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාමාර්ග සැසියට *Literary Pursuit, in SHM. Jameel (eds), The Muslim Heritage of Eastern Sri Lanka,* නමින් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරිම.

- අචාර්ය. අබ්දුල් ෆාරිඩ් මොහොමඩ්. අෂ්රෆ්(2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා "කළමණාකරණය, තාක්ෂණය සහ විද්‍යාව තුලින් පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී *"Translation Practices and Nation Development (A Critical Study Based on Sri Lanka)"* උධෘතය පළ කිරිම.

- අචාර්ය. අබ්දුල් ෆාරිඩ් මොහොමඩ්. අෂ්රෆ් (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා "කළමණාකරණය, තාක්ෂණය සහ විද්‍යාව තුලින් පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී *"Post War Development and the Contribution of Language: A view on Sri Lankan Environment'* උධෘතය පළ කිරිම.

- මොහොමඩ්. අබ්දුල් සලාම් ෆාතිමා සාදියා මිය. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා "කළමණාකරණය, තාක්ෂණය සහ විද්‍යාව තුලින් පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී *"The poems after the war- with special reference to Ampara District"* උධෘතය පළ කිරිම.

- අචාර්ය. අබ්දුල් ෆාරිඩ් මොහොමඩ්. අෂ්රෆ්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය මගින් ප්‍රකාශිත කලාම් සඟරාවේ 4 වන වෙළුම සඳහා *"Translation and its Importance",* නමින් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරිම.

- මොහොමඩ්.අබ්දුල් සලාම් ෆාතිමා සාදියා මිය. (2011), පන්පාඩු සඟරාවට *"Malaiyahach Siruvarhalin Nilai – Malaiyahak Kavithaihalai Adippadaiyahakkonda Aayvu"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරිම.

**ඉදිරිපත් කිරිම්:**

- අචාර්ය.එස්. අනුසියා. (2011), කොළඹ දෙමළ සංගම්හි ජනවාරි 06– 09 දක්වා පැවති ජ්‍යාත්යන්තර දෙමළ කලාවේදීන්ගේ සම්මේලනයේදී *"Novel" written by women* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරිම.

- අචාර්ය.එස්. අනුසියා. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති පළමුවන අන්තර්ජාතික සම්මන්ත්‍රණයට *"Rebuilding Deep Ethnic Coherence in the Post Conflict Situation – A Case Study"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරිම.

- අචාර්ය.එස්. අනුසියා. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද ප්‍රාදේශිය සංවර්ධනය නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට *"Various Trends in Post – War Tourism and Development in the Eastern Province"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරිම.

- අචාර්ය. එම්. ඒ. මොහොමඩ් රමීස්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද ජාතික සම්මන්ත්‍රණයට *"Politics of Feminine Language: A Study based on Anar's Poetries"*, නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- අචාර්ය. එම්. ඒ. මොහොමඩ් රමීස්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී *"Muslims' Discourses in Post-war Sri Lanka: A Study based on Media News"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- සිත්ති රාහිලා උම්මා මොහොමඩ් සියාද් (2011), සමාජ විද්‍යා දෙපාර්තමේතුව විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය නමින් පවත්වන ලද වැඩමුළු මාලාව සඳහා *"Ilakkanam Katpathil Maanavarhal Ethirno:kkum Prachchinaihalail Adippadayahak Konda Aayvu*", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- කනගසබාපති රඝුපරන්. (2011), මැලේසියාවේ කුවාලා ලම්පූර්ව දී මැයි මස 20 - 22 දක්වා පැවති අන්තර්ජාතික ඉස්ලාමීය දෙමළ සාහිත්‍යය සමුළුව සඳහා *"Ilankai Islamiya Thamil Ilakkiya Varalaaru"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- කනගසබාපති රඝුපරන්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය ප්‍රාදේශීය සංවර්ධනය නමින් සංවිධානය කරන ලද ජාතික සම්මන්ත්‍රණයට *"Ilangaith Thamililakkiyangalil Mahaawali Gangai"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- කනගසබාපති රඝුපරන්. (2011), හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කොළඹදි බ්‍රිතාන්‍යය යටත්විජිතවාදය සහ නවීකරණය නමින් සංවිධානය කරන ලද වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයට *'Piriththaaniyar Aatchikkaalaththil Samaya Nilai: Sandaiyilirunthu Samarasaththitku'* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- අචාර්ය. අබ්දුල් ෆාරිඩ් මොහොමඩ්. අෂ්රෆ්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා "කළමණාකරණය, තාක්ෂණය සහ විද්‍යාව තුලින් පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී *"Translation Practices and Nation Development (A Critical Study Based on Sri Lanka)"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- අචාර්ය. අබ්දුල් ෆාරිඩ් මොහොමඩ්. අෂ්රෆ්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා "කළමණාකරණය, තාක්ෂණය සහ විද්‍යාව තුලින් පශ්චාත් යුධ ආර්ථික සංවර්ධනය:,මැයෙන් පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී *"Post War Development and the Contribution of Language: A view on Sri Lankan Environment"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- අචාර්ය. අබ්දුල් ෆාරිඩ් මොහොමඩ්. අෂ්රෆ්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට *"Peace and Social Harmony for the Regional Development: The Possibility through the Trilingual Studies in Sri Lanka"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- අචාර්ය. අබ්දුල් ෆාරිඩ් මොහොමඩ්. අෂ්රෆ්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට *"Attempts for the Creation of Technical Terms Centre Around Translation: A view Based on the field of Information Technology"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- මොහොමඩ්. අබ්දුල් සලාම් ෆාතිමා සාදියා මිය. (2011), රාජකීය ආසියාතික සංගමය කොළඹ දි පවත්වන ලද වාර්ෂික සම්මන්ත්‍රණයට *"Dowry System and its Practice among Srilankan Muslims – with Special Reference to Ampara District"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- එම්.ආර්.රිසානා. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට*"The Problem Faced by the Students in Learning Tamil Grammar – A Study Based on Palamunai Area"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- ජමීලා හනුන් උමර්. (2011). ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- සෙල්වකුමාරි සිවලින්ගම්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට *"Kaalanithuwa Aatchiyil Indhu Samaya Paathukappu Mayatchikal"* පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- ෆවුසුල් කරිමා. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට *"English-Tamil Bilingualism in the Balangoda Municipality"* පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- එම්.එච්.එෆ්.ෂිම්ලා. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට *"The Role of Technology in Teaching English effectively"* පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

- තස්මිනා අෂ්රෆ්. (2011) ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය සංවිධානය කරන ලද "ප්‍රාදේශීය සංවර්ධනය-2011" නමින් දෙසැම්බර් 10-11 දක්වා පැවති ජාතික සම්මන්ත්‍රණයට *"Regional Development possibility through the Trilingual studies"* පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

**පත්‍රිකා:**

**ප්‍රකාශිත:**

- අචාර්ය.එස්. අනුසියා. (2011),ත්‍රිකුණාමලය කලාප අධ්‍යාපන කාර්යාලය CSDI මගින් ප්‍රකාශිත "නිත්තිලම්" වාර්ෂික සඟරාවෙහි *"Colebrook Cameroon Reforms"* නම් පත්‍රිකාව පළවන ලදි.

- අචාර්ය.එස්. අනුසියා. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය මගින් ප්‍රකාශිත කලාම් සඟරාවේ 4 වන වෙළුමෙහි *"The Idea of Progress in History"* නම් පත්‍රිකාව පළවන ලදි.

- අචාර්ය.එස්. අනුසියා. (2011), කොළඹ, කාන්තා හා මාධ්‍යය ජාලය මගින් ප්‍රකාශිත කාන්තා වාදයේ විශිෂ්ටත්වය නම් වූ සඟරාවේ පළමු කලාපයෙහි *"Political Participation of Women – A Review"* නම් පත්‍රිකාව පළවන ලදි.

- කනගසබාපති රඝුපරන්. (2011), කොළඹ තමිල් සංගම් මගින් *"Aindhaviththaan Yaar?" In the Muppaal Thirukkural Maanaattuch chirappu Malar,* නම් පත්‍රිකාව පළකරන ලදි.
- කනගසබාපති රඝුපරන්. (2011), කොළඹ තමිල් සංගම් මගින් ප්‍රකාශිත සන්ගත්තමිල්,ඉතල් - 4 හි *"Sambantharin Thirukkadaikkaappuch Cheyyulhal"* නම් පත්‍රිකාව පළවන ලදි.
- කනගසබාපති රඝුපරන්. (2011), කොළඹ තමිල් සංගම් මගින් ප්‍රකාශිත සන්ගත්තමිල්,ඉතල් - 5 හි *"Naavalarin Uthaarana Aaluhai"* නම් පත්‍රිකාව පළවන ලදි.
- කනගසබාපති රඝුපරන්. (2011), හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත පන්පාඩු- ඉතල් 20:1 හි *"Kumaara Suwaamip Pulavar: Naveena Mayappaattin Pangaali"* නම් පත්‍රිකාව පළවන ලදි.
- කනගසබාපති රඝුපරන්. (2011), හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් *"Thennindhiya Isaiyyin Potkaalam" in Thamilin NavaYuham Aayvarangach chirappu Malar,* නම් පත්‍රිකාව පළකරන ලදි.
- කනගසබාපති රඝුපරන්. (2011), හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත *Aranerikkaalamum Thamilahap Panpaattu Maraphuhalum*,ග්‍රන්තයෙහි *"Aranerikkaala Ilakkiyangalin Alahiyalil Arasiyal",* නම් පත්‍රිකාව පළවන ලදි.
- කනගසබාපති රඝුපරන්. (2011), ත්‍රිකුණාමලය කලාප අධ්‍යාපන කාර්යාලය මගින් ප්‍රකාශිත "නිත්තිලම්" වාර්ෂික සඟරාවෙහි *"Professor Kaarthikesu Sivaththambi"* නම් පත්‍රිකාව පළවන ලදි.
- කනගසබාපති රඝුපරන්.(2011), මැලේසියාවේ, අන්තර්ජාතික ඉස්ලාමීය දෙමළ සාහිත්‍යය සමුළුවේ පර්යේෂණ සඟරාවෙහි *"Ilankai Islamiya Thamil Ilakkiya Varalaaru"* නම් පත්‍රිකාව පළවන ලදි.

**ඉදිරිපත් කිරීම්:**

- අචාර්ය.එස්. අනුසියා. (2011), හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ඔක්තෝබර් 14 – 16 දිනයන්හි කොළඹදි බ්‍රිතාන්‍යය යටත්විජිතවාදය සහ නවීකරණය නමින් පැවති වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයට *"Development of Historiography during British Period in India"* නම් පත්‍රිකාව ඉදිරිපත් කරන ලදි.

## කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය

**පර්යේෂණ පත්‍රිකා:**

**ප්‍රකාශිත:**

- අතම්බාවා ජන්ෆර්, ෂෙහාම්. ඒ.එම් (2011), කළමණාකරනය,තොරතුරු තාක්ෂණය,වාණිජ්‍යය,පිළිබඳ පර්යේෂණාත්මක ජ්‍යාත්යන්තර සඟරාවේ පළමු වෙළුමහි (6) 2011.*"A study on the Relationship between Corporate financial Performance and Corporate Social Responsibility",* නම් පත්‍රිකාව පළවන ලදි.

**ඉදිරිපත් කිරීම්:**

- අචාර්ය.ඒ.ජන්ෆර්. (2011),ජාතික සම්මන්ත්‍රණයක් සඳහා *"Effect of Multicollinearity in Unbiased Regression Model",*නම් පත්‍රිකාව ඉදිරිපත් කරන ලදි.

- අචාර්ය.ඒ.ජන්ෆර්. (2011), ජාතික සම්මන්ත්‍රණයක් සඳහා *"Analyzing the Performance Variation between Competitive and Non-Competitive Examinations among Grade 5 Students",* නම් පත්‍රිකාව ඉදිරිපත් කරන ලදි.

- එස්. අතම්බාවා. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දි *"Strategies Technology Adoption and its current state and implications on agri business for making sustainable development in Eastern Province of Sri Lanka"* නම් පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කරන ලදි.

- ඒ. එල්. එම්. ඒ. ෂමීම් (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අප්‍රේල් මස 19-21 දක්වා පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා *"An assessment of the role of business entrepreneurs in conflict Transformation – A case study of South Eastern Sri Lanka"* මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ඒ. එල්. එම්. ඒ. ෂමීම් (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අප්‍රේල් මස 19-21 දක්වා පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා "*The role of Business community in the business environment: Through the lens of corporate social responsibility*" මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ඒ. එල්. එම්. ඒ. ෂමීම් (2011), ඉන්දියවේ ආනාමාලායි විශ්වවිද්‍යාලයේ ජුලි 28-30 දින පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා *"A Global Climate Change: A business strategy perspective"* මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ඒ. එල්. එම්. ඒ. ෂමීම්. (2011), ඉන්දියාවේ සායිරාම් කළමනාකරණ ආයතනයේ 2002 වසරේ සැප්තැම්බර් මස 22-23 දින පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා *"The entrepreneurs' Sustainable Network Approach: A way to improve the multi ethnic business and Social Relation Ship in the post conflict context*" පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ඉස්මයිල් එම්.බී. එම් (2011), ව්‍යාපාර හා තොරතුරු පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා *"Problem Identification (PI) using Participatory Rural Approach (PRA): A special reference to Aalimsenai of Oluvil"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ඉස්මයිල් එම්.බී. එම් (2011), ව්‍යාපාර හා තොරතුරු පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා "*Risk Assessment (RA) in Transaction Processing System (TPS) : An approach of quantitative and qualitative risk Assessment of Hatton National Bank – HNB - in Ampara Coastal Belt Area (ACBA)"* පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ඉස්මයිල් එම්.බී. එම් (2011), තිරසාර සංවර්ධනය සඳහා ව්‍යාපාර හා තාක්ෂණ අංශයේ නිපුණතා වර්ධනය සඳහා වූ අන්තර්ජාතික සම්මන්ත්‍රණයට *Association between brand preferences of Market leader & Market Niche in weaving Industry of Maruthamunai"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි..

- ඒ. එම්. එම්.මුස්තාෆා (2011), දෙසැම්බර් 16 හා 17 දිනවල ඩුබායි දි පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණයට *"Sri Lanka Tourism (SLT) A Forecast of Foreign Tourists (FFT) innovative Business & Technology Strategies for Developing countries*" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ඒ. එම්. එම්.මුස්තාෆා, එස්. සිවරාජසින්හම්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා පැවති අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා *"An Empirical Analysis of Stochastic Behavior of Sri Lankan Exchange Rate*" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

- ඒ. එම්. එම්.මුස්තාෆා, එස්. සිවරාජසින්හම්. (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අප්‍රේල් 19-21 දක්වා පැවති අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා "*Dynamic Behavior of Red Onion Prices in Jaffna District"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

- ඒ. එම්. එම්.මුස්තාෆා, කේ. ඒ.ඩබ්.පී.වී.පෙරේරා (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය අප්‍රේල් 19 සිට 21 දක්වා ඇති අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා "*Demand for State Lotteries in post War period. A case study from Ampara District in Sri Lanka*" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

- ඒ. එම්. එම්.මුස්තාෆා (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය අප්‍රේල් මස 19-21 දක්වා පැවත අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා *"Impact of Foreign Direct Investment on Gross Domestic Product and Suggestion for Attraction of FDI after the War in Sri Lanka*" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

- එම්. බි.මොහොමඩ් ඉර්ෂාඩ්. (2011), *"An Analysis on the Consumers' Adoption of online Banking in Sri Lanka*" පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

**පොත්:**

- එස්.ගුණපාල. (2011), *"Islamic Banking System in Sri Lanka: A paradigm of success", ISBN* 978-93-80812-05-2 නමින් පොතක් පළ කරන ලදි.

- එස්.ගුණපාල. (2011), "Banking Sector in the Global Scenario", මනොන්මනියම් සුන්දරරායනම් විශ්වවිද්‍යාලය-ඉන්දියාව,ශ්‍රී මරුති ප්‍රකාශකයෝ,චෙන්නායි – 600049.

## ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂාව

**පර්යේෂණ පත්‍රිකා:**

**ඉදිරිපත් කිරීම්:**

- එම්. එස්. එම්. ජලාල්දින් (2011), ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලද වාර්ෂික සම්මන්ත්‍රණය සඳහා *"Resettlements and recovery* of *livelihood of 2005 Tsunami victims of Ampara district with special reference to Maruthamunai village"* පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

- එම්. එස්. එම්. ජලාල්දින් (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය අප්‍රේල් මස 19-21 දක්වා පැවත අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා *"Challenges and Issues of Contemporary Sri Lanka Muslim Education with Special Reference to Apmarai District Muslim Education"* නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

- එම්. එස්. එම්. ජලාල්දින් (2011), ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය අප්‍රේල් මස 19-21 දක්වා පැවත අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා *"Islamic Revivalism in contemporary Sri Lanka with special reference to Amparai District.* " නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

## 9. වැඩසටහන්,සම්මන්ත්‍රණ,වැඩමුළු පිළිබඳ විස්තර:

| විෂයය | සහභාගි වීම | සම්පූර්ණ කිරීම | ඉදිරිපත් කිරීම |
|---|---|---|---|
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 16 | - | 07 |
| ආ.පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | 45 | - | 10 |
| ඈ ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | 07 | - | - |
| ඉ.සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 05 | - | - |
| ඊ.වෙනත් | - | - | - |
| එකතුව | **73** | **-** | **17** |

## 10. ප්‍රදානයන් පිළිබඳ විස්තර:

| විෂයය | ප්‍රදාන සංඛ්‍යාව | අධ්‍යතිකයන් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදානයන් | 01 | - | - |
| ආ. ජාතික ප්‍රදානයන් | 08 | 01 | - |
| ඇ. ජ්‍යාත්‍යන්තර ප්‍රදානයන් | - | - | - |
| ඈ.වෙනත් | - | - | - |
| එකතුව | 09 | 01 | - |

## 11. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර

| පීඨය | පාඨමාලා | මාධ්‍යය | සහතිකපත් | ඩිප්ලෝමා | පශ්චාත් ඩිප්ලෝමා | ශාස්ත්‍රප ති | දර්ශන පති | දර්ශනශූ රි |
|---|---|---|---|---|---|---|---|---|
| අදාල නොවේ | | | | | | | | |

## 12. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර:

| විෂයය | 2010 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| අ. පුද්ගලික වැටුප් | 165,789,977.41 | 207,447,319.00 |
| ආ. ගමන් | 1,248,610.88 | 1,988,772.00 |
| ඇ. සැපයුම් | 14,492,336.37 | 20,806,987.00 |
| ඈ. නඩත්තු | 10,127,434.74 | 23,306,967.00 |
| ඉ. ගිවිසුම්ගත සේවා | 46,538,301.25 | 48,851,790.00 |
| ඊ. වෙනත් | 9,916,699.15 | 10,482,994.00 |
| එකතුව | **247,213,359.80** | **312,884,829.00** |

## 13. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර:

| විෂයය | 2010 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| අ. කාර්යාල උපකරණ,ලි බඩු අත්පත් කර ගැනීම | 10,495,826.00 | 15,096,000.00 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | 5,962,000.00 | 5,464,000.00 |
| ඇ. ගොඩනැගිලි අත්පත් කර ගැනීම | 7,491,293.00 | 14,490,000.00 |
| ඈ.වෙනත් (පොත්) | 1,976,150.00 | 3,550,000.00 |
| ඉ. සන්නිවේදන | 4,592,870.00 | 15,000.00 |
| එකතුව | **30,518,139.00** | **38,615,000.00** |

## 14. ව්‍යාපෘති පිළිබඳ විස්තර: (දේශිය අරමුදල්)

| නම සහ විස්තර | ණය / ප්‍රදාන | ප්‍රදානිය ආයතනය | මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මිලියන | ප්‍රතිපූරණය කළහැකි විදේශාධාර (රු.මිලියන) | දේශිය අරමුදල් (රු.මිලියන) |
|---|---|---|---|---|---|
| කලා සහ සංස්කෘතික පීඨය ගොඩනැගිලි සංකීර්ණය | | | 137.00 | - | - |
| කළමණාකරන හා වාණිජ පීඨය ගොඩනැගිලි සංකීර්ණය | | | 160.00 | - | - |
| පුස්ථකාලය | | | 200.00 | - | - |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | | | 170.00 | - | - |
| ව්‍යවහාරික විද්‍යා පීඨය- නිල නිවාස | | | 149.00 | - | - |
| එකතුව | | | **816.00** | - | - |

## ව්‍යාපෘති පිළිබඳ විස්තර: (විදේශිය අරමුදල්)

| නම සහ විස්තර | ණය / ප්‍රදාන | ප්‍රදානිය ආයතනය | මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මිලියන) | ප්‍රතිපූරණය කළහැකි විදේශාධාර (රු.මිලියන) | දේශිය අරමුදල් (රු.මිලියන |
|---|---|---|---|---|---|
| ගැහැණු සහ පිරිමි නේවාසිකාගාර- ගොඩනැගිලි සංකීර්ණය | ණය | අරාබි ආර්ථික සංවර්ධන ය සඳහා වු කුවෙට් අරමුදල | 315.00 | 283.50 | 31.50 |
| කාර්ය මණ්ඩල නිල නිවාස -ගොඩනැගිලි සංකීර්ණය | | | 160.00 | 144.00 | 16.00 |
| ශිෂ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | | | 60.00 | 54.00 | 6.00 |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | | | 140.00 | 126.00 | 14.00 |
| ක්‍රීඩා පිය සහ ක්‍රීඩා ගාරය | | | 55.00 | 49.50 | 5.50 |
| තාක්ෂණ පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | | | 130.00 | 117.00 | 13.00 |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | | | 24.00 | 21.60 | 2.40 |
| එකතුව | | | **884.00** | **795.60** | **88.40** |

## 15. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර: (දේශිය අරමුදල්- මිලියන)

| ණම | මුලු පිරිවැය ඇස්තමේන්තුව (රුපියල්) :මිලියන- | 2010 වර්ෂයේ වැය (රුපියල්) :මිලියන- | 2011 වර්ෂයේ වැය (රුපියල්) :මිලියන- | 31/12/2011 දිනට සමුච්චිත පිරිවැය (රුපියල්) :මිලියන- | භෞතික කාර්යසාධන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| කලා සහ සංස්කෘතික පීඨය ගොඩනැගිලි සංකීර්ණය | 137.00 | 4.75 | 2.28 | 131.66 | 100 |
| කළමණාකරන හා වාණිජ පීඨය ගොඩනැගිලි සංකීර්ණය | 160.00 | 40.47 | 36.48 | 76.95 | 64 |
| පුස්ථකාලය | 200.00 | 54.42 | 50.02 | 104.44 | 70 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 170.00 | 2.90 | 10.96 | 13.86 | කොන්ත්‍රාත්කරු වැඩබිමට ප්‍රවේශ වි ඇත. |
| ව්‍යවහාරික විද්‍යා පීඨය- නිල නිවාස | 149.00 | - | 21.53 | 21.53 | කොන්ත්‍රාත්කරු වැඩබිමට ප්‍රවේශ වි ඇත. |
| එකතුව | **816.00** | **102.54** | **121.27** | **348.44** | |

### ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර: (විදේශීය අරමුදල්- මිලියන)

| නම | මුලු පිරිවැය ඇස්තමේන්තුව (රුපියල්) :මිලියන- | 2010 වර්ෂයේ වැය (රුපියල්) :මිලියන- | 2011 වර්ෂයේ වැය (රුපියල්) :මිලියන- | 31/12/2011 දිනට සමුච්චිත පිරිවැය (රුපියල්) :මිලියන- | භෞතික කාර්යසාධන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| ගැහැණු සහ පිරිමි නේවාසිකාගාර- ගොඩනැගිලි සංකීර්ණය | 315.00 | 154.97 | 17.73 | 304.82 | 100 |
| කාර්ය මණ්ඩල නිල නිවාස -ගොඩනැගිලි සංකීර්ණය | 160.00 | 73.64 | 1.62 | 146.02 | 100 |
| ශිෂ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | 60.00 | 20.70 | 10.92 | 37.00 | 100 |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | 140.00 | 45.69 | 65.75 | 122.42 | 100 |
| ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩා ගාරය | 55.00 | 24.95 | 18.98 | 43.93 | 100 |
| තාක්ෂණ පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | 130.00 | 37.64 | 50.49 | 98.68 | 100 |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | 24.00 | 11.87 | 9.39 | 21.26 | 100 |
| **එකතුව** | **884.00** | **369.46** | **174.88** | **774.13** | |

### 16. මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ විස්තරය (වැය)

| විෂයය | 2011 වර්ෂයේ ප්‍රතිපාදන (රුපියල්) | 2011 වර්ෂයේ වැය (රුපියල්) | ඉතිරිය / අතිරික්තය (රුපියල්) |
|---|---|---|---|
| අ. පුනරාවර්ථන - ව්‍යාපෘති හැර | 315,162,000.00 | 312,884,829.00 | 2,277,171.00 |
| ආ. ප්‍රාග්ධන - ව්‍යාපෘති හැර | - | - | - |
| ඇ. ව්‍යාපෘති - දේශියව මූල්‍යනය කරන ලද | 126,500,000.00 | 126,400,000.00 | 100,000.00 |
| ඇ. ව්‍යාපෘති - විදේශියව මූල්‍යනය කරන ලද | - | - | - |
| **එකතුව** | **441,662,000.00** | **439,284,829.00** | **2,377,171.00** |

## 17. මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ විස්තරය (ඉපයූ ආදායම)

| විෂයය | 2011වර්ෂයේ ප්‍රතිපාදන (රුපියල්) | 2011 වර්ෂයේ රැස්කිරීම් (රුපියල්) | ඌනතාවය / අතිරික්තය (රුපියල්) |
|---|---|---|---|
| අ. උපාධි අධ්‍යාපනය | 215,000.00 | 230,000.00 | (15000) |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යාපනය | - | - | - |
| ඇ. උපදේශන | - | - | - |
| ඇ. වෙනත් | 7,762,000.00 | 8,942,000.00 | (1,180,000) |
| **එකතුව** | **7,977,000.00** | **9,172,000.00** | **(1,195,000)** |

## 18. මූල්‍ය කාර්ය සාධනය විශ්ලේෂනය – 2011

| විෂයය | ශ්‍රිතය | ඒක ශිෂ්‍ය වැය (රුපියල්) |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්ථන (වැය) | පුනරාවර්ථන වැය / සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | |
| ආ. ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන (වැය) | ප්‍රාග්ධන වැය/ සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | |
| එකතුව | | |

## 19. යටිතල ව්‍යුහමය පහසුකම් ලැබීම් පිලිබඳ විස්තරය - 2011 :

| යටිතල ව්‍යුහමය පහසුකම් විස්තරය | වැය (රුපියල්) | භෞතික කාර්යසාධනය |
|---|---|---|
| කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය | | කෙරිගෙන යන |
| පුස්තකාලය | | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | | |
| වැඩ බෙදා වෙන් කිරීම සහ වායුසමීකරණ සවිකිරීම | | සම්පූර්ණ කරන ලද |
| සංස්කෘතික කෞතුකාගාරය පිහිටුවීම | | |
| වට තාප්පයක් (පැරපොට් වෝල්) | | |

## 20. විගණකාධිපති වාර්තාව

රඑන්/ඒච්ම්/ඒ/එස්ඊයුඑස්එල්/ එෆ්එස්/2011 2012 නොවැම්බර් 09 දින

උප කුලපති,
ශ්‍රී ලංකා අග්නි දිග විශ්ව විද්‍යාලය.

**ශ්‍රී ලංකා අග්නි දිග විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා අග්නි දිග විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2012 ජුනි 08 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අග්නි දිග විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.1,416,921,565 ක් වූ දේපල , පිරියත හා උපකරණ වටිනාකම පොත් අගය මත පදනම් වී තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.22,716 ක් වූ අනුස්මරණ අරමුදල් මත පොලිය මෙහෙයුම් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) රු.334,128 ක් වූ වාහන අළුත් වැඩියාවන් පුනරාවර්ථන වියදම වෙනුවට සාවද්‍යව ප්‍රාග්ධන වියදම් ලෙස වර්ගීකරණය කර තිබුණි.

2.2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟ හිට් සේවක ණය

-----------------------

(i) රු.321,955 ක් වූ ආපදා ණය දීර්ඝ කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ii) නිලධාරියකුට ආපදා ණය වලට අමතරව , ගෙවන ලද රු.41,962 ක් වූ වාහන ණය වර්ෂ 15 කට වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(iii) ආපදා ණය වලට අමතරව පරිගණක ණයක් ලෙස නිලධාරියෙකුට ගෙවන ලද රු.9,000 ක් වර්ෂ 9 කට වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ආ) නිරවුල් නොකළ අත්තිකාරම්

------------------------------

පොත් මිලදී ගැනීම සඳහා ලබාදුන් රු.81,488 ක අත්තිකාරම් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි.

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| (i) 1991 ඔක්තෝබර් 04 දිනැති අංක 45/91 හා 2010 ජුනි 07 දිනැති අංක 9/2010 දරන චක්‍රලේඛ | කාර්යාලය හා නිවස අතර ගමන් කිරීම සඳහා සහා සාමාජිකයන්ට තම පෞද්ගලික වාහන යොදා ගැනීම වෙනුවෙන් රු.107,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | විශ්ව විද්‍යාලයට අනුයුක්ත වාහන 20 කට අදාලව ඉන්ධන පරිභෝජනය මාස 6 කට වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXVII පරිච්ඡේදයේ 9.4 වගන්තිය | මෝටර් වාහන පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 1998 මාර්තු 10 දිනැති අංක පීඊ/1/174/11(ආ) දරන ලිපිය | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිලධාරීන්ට රු.282,567 ක් වූ භාෂා දීමනාව ගෙවා තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1.4 වගන්තිය | බාහිර කථිකාචාර්යවරුන් 9 දෙනෙකුට ඔවුන්ගේ අදාල දෙපාර්තමේන්තු වලින් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව දේශන ලබාදී තිබුණි. |
| (ඉ) 1997 නොවැම්බර් 21 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 721 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව තාවකාලික සහකාර කථිකාචාර්යවරුන් දෙදෙනෙකු 11 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු ලෙස උසස් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.398,504,487 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.368,771,300 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.341,832,350 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.56,672,137 දක්වා අඩුවී තිබුණු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.276,563,463 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු.92,207,837 ක් විය. ඒ අනුව රු.35,535,700 කින් ඌනතාවයේ අඩුවීමක් දැක්වුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්යයන් කිහිපයක විස්තර ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පවත්වන ලද උපාධි පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2011 | 2010 | 2011 | 2010 |
| ව්‍යවහාර විද්‍යාව | 184 | 95 | 15 | 44 |
| කලා හා සංස්කෘතික | 118 | 165 | 02 | 235 |
| කළමනාකරණ හා වානිජ්‍යය | 274 | 238 | 01 | 55 |
| ඉස්ලාම් හා අරාබි | 243 | 164 | 04 | 66 |
| එකතුව | 819 | 662 | 22 | 400 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 22% ක් හා 30% ක් පිළිවෙලින් ව්‍යවහාර විද්‍යා පීඨය හා ඉස්ලාම් හා අරාබි පීඨය සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍යයින් විය. ඒ අනුව එම පීඨයන් සඳහා සමාලෝචිත වර්ෂයේ බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් 94% කින් හා 48% කින් වැඩිවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කලා හා සංස්කෘතික පීඨය සහ කළමනාකරණ හා වාණිජ්‍යය පීඨයට බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 10.5% කින් හා 2.5% කින් අඩුවී තිබුණි.

(ඇ) උපාධි ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී 95% කින් අඩුවී තිබුණි.

4.2 මහපොළ හා ශිෂ්‍යාධාර

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය තුළදී ශිෂ්‍යයින් 603 දෙනෙකුට මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් රු.9,936,350 ක් විය.

(ආ) 2011 වර්ෂය තුළදී ශිෂ්‍යයින් 1067 දෙනෙකුට ශිෂ්‍යාධාර ගෙවීම් රු.15,734,000 ක් විය.

4.3 වෙනත් කටයුතු

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථිර කථිකාචාර්යවරුන් සංඛ්‍යාව 85 ක් වූ අතර එක් කථිකාචාර්යවරයකුට සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 20 ක් විය.

(ආ) ක්ෂය නොමැතිව මුළු මෙහෙයුම් වියදම රු.338,555,180 ක් වූ අතර මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1726 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය රු.196,150 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය රු.186,275 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පිරිමි ශිෂ්‍යයින් 584 දෙනෙකුට හා ශිෂ්‍යාවන් 993 දෙනෙකුට නේවාසිකාගාර පහසුකම් සපයා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු නේවාසිකාගාර වියදම රු.4,118,386 ක් විය.

4.4 බලය නොලත් ගනුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව විශ්ව විද්‍යාල පීඨාධිපතිවරු 4 දෙනෙකුට නිවස හා කාර්යාලය අතර ගමන් කිරීම සඳහා තම වාහනය යොදා ගැනීම වෙනුවෙන් රු.42,532 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ගරු දීමනාවක් ලෙස රු.324,890 ක මුදලක් නිලධාරීන්ට ගෙවා තිබුණි.

4.5 වත්කම් කළමනාකරණය

---------------------------

රු.102,798 ක් වටිනාකමවූ පාරිභෝජ්‍ය භාණ්ඩ විෂයයන් 6 ක් වර්ෂ 8 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

සමාලෝචිත වර්ෂය තුළ වාහන 9 ක් විශ්ව විද්‍යාලය සතුව පැවතියද රු.426,347 ක මුදලක් වාහන කුලී ලෙස ගෙවා තිබුණි.

4.7 ව්‍යාපෘති ප්‍රමාදයන්

---------------------

විශ්ව විද්‍යාලයේ ප්‍රධාන සැලැස්ම පිළියෙල කිරීම සඳහා 2006 වර්ෂය තුළදී උපදේශක සේවා ලෙස රු.16,886,550 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද එම ප්‍රධාන සැලැස්ම 2012 අගෝස්තු 31 වන විටත් පිළියෙල කර නොතිබුණි.

4.8 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.13 වගන්තිය ප්‍රකාරව භාණ්ඩ සැපයීම සඳහා එළඹි ගිවිසුම් වල ප්‍රමාණ කළ අලාභ අයකර ගැනීම සඳහා විධිවිධාන ඇතුළත් කර නොතිබුණි.

(ආ) සැපයීම් කමිටුව හා මිලදී ගැනීම් අධියාචනා පත්‍රය මගින් (PRN) අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.2,544,358 ක වටිනාකමට පාලක සභා කාමරය සඳහා මේසයක් හා පිළිගැනීම් කවුන්ටරය මිලදී ගෙන තිබුණි. ඉහත විෂයයන් සැපයීමට සමාලෝචිත වර්ෂය තුළදී සැපයුම්කරුවන් 17 දෙනෙකු ලියාපදිංචි වී සිටියද , ඔවුන්ගෙන් මිල කැඳවීම් සිදුකර නොතිබුණි. තවද ටෙන්ඩර් කොන්දේසි වලට පටහැනිව රු.1,844,573 ක් අත්තිකාරමක් ලෙස ගෙවා තිබූ අතර මුදල් රෙගුලාසි 753(2) ප්‍රකාරව භාණ්ඩ ලැබීම් පත්‍රිකා (GRN) නිකුත් කර නොතිබුණි.

4.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

2010 හා 2011 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වී සමාලෝචිත වර්ෂය තුළදී එම සමාගමෙන් එකතුව රු.3,352,234 ක ප්‍රසම්පාදනයන් සිදුකර තිබූ සමාගමක කළමනාකරණ අධ්‍යක්ෂවරයකු 2010 වර්ෂයේ සිට විශ්ව විද්‍යාල පාලක සභාවේ සාමාජිකයකු ලෙස විශ්ව විද්‍යාලයේ කටයුතු සඳහා ඔහුගේ මැදිහත්වීමෙන් සිදුවන ගැටුම්කාරී තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගැනීමෙන් තොරව පත් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2006- 2015 කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම 2012 ඔක්තෝබර් 31 දක්වා පාලක සභාව විසින් අනුමත කර නොතිබුණි.

### 5.2 වාර්ෂික වාර්තාව සභාගත කිරීම

2010 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2012 අගෝස්තු 31 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත වියදම හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) අත්තිකාරම් ගෙවීම

(ඈ) පුස්තකාල පරිපාලනය

(ඉ) ඇපකර හා ගිවිසුම් කඩකිරීම

(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

## 21. විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

එස්ජ්‍යූ/වීසී/බී/ඒජී/2011

ඔබේ අංකය : ජීඑන්/ඒඑම්/ඒ/එස්ජ්‍යූඑස්එල්/එෆ්එස්/2011

2013 ජනවාරි 03 දින.

**<u>ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (2) හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

2012 නොවැම්බර් 09 වන දින නිකුත්කරන ලද ඔබගේ ඉහත වාර්තාව 2012 දෙසැම්බර් 04 වන දින ලද අතර, ඒ සඳහා අපගේ නිරීක්ෂණ පහත සඳහන් වේ.

**2.0 මූල්‍ය ප්‍රකාශනය.**

**2.1 තත්වාගණය කරන ලද මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.**

**2.2.1 <u>ගිණුම් ප්‍රතිපත්ති</u>**

නිවැරදි කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතියි.වත්කම් සත්‍යාපන සිදු කරමින් පවතියි.

**2.2.2 <u>ගණකාධිකරණ අඩුපාඩු</u>**

(අ) සටහන් කර ගතිමි.නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙය JX-3377 දරන වාහනයේ සිදුකල ප්‍රධාන අළුත්වැඩියාවක් බැවින් එම වියදම ප්‍රාග්ධනිත කර ඇත.

**2.2.3 <u>ලැබිය යුතු ගිණුම්.</u>**

(ස) නොගෙවූ ණය

| **නම** | **මුදල** | **තත්වය** |
|---|---|---|
| එම්. එම්. එම්. රාෆික් | 56765 | සේවය අතහැර ඇත |
| එස්. ටි. ආරිෆ් | 207300 | මෙම මුදල් ඔවුන්ගේ |
| ඒ. ආර්. එම්. ඉම්තියාස් කර | 29058 | අර්ථසාධක අරමුදලින් අය ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| එස්. එච්. අමීර් | 28832 | 2012 දෙසැම්බර් මස දී යලි අය කරගෙන ඇත. |

(ii ) 2012 දෙසැම්බර් මස දි  අය කරගෙන ඇත.

(iii) දැනට සේවයේ නොමැති එම්. එම්. එම්. රාෆික් මහතාගේ හිඟ ණය මුදල ඔහුගේ අර්ථසාදක අරමුදලින් අයකර ගැනීමට කැමැත්ත පලකර ඇති අතර ඒ අනුව ක්‍රියා කරනු ලැබේ.

(iv) නොපියවූ අත්තිකාරම්

පුස්තකාලය විසින් වර්ෂය සඳහා අදාල සියළුම කලාප ලැබෙන තෙක් සිටිම නිසා වාරසඟරා සඳහා ලබා දි ඇති අත්තිකාරම් නිරවුල් කිරිමට ගෙවූ දිනයේ සිට මාස 12ක කාලයක් ගතවේ.මෙම වර්ගයට නොවැටෙන අත්තිකාරම් අය කර ගැනිම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ.

### 2.2.4 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>

**අ) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>**

1. 45/91 සහ 9/2010 - මේ වන විට රා.ප චක්‍රලේඛ 4/91 සම්පූර්ණයෙන්ම අනුකූලව ක්‍රියා කරනු ලබයි

11. චක්‍රලේඛ 41/90 - සියළුම වාහන වල ඉන්ධන පරිභෝජන පරික්ෂාව මේ වන විට කරගෙන යනු ලබයි

**<u>ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය</u>**

xxvii වන පරිච්ඡේදයේ 9.4 වගන්තිය - මෝටර් වාහන පිළිබඳ රෙජිස්ටරයක් මේ වන විට පවත්වාගෙන යනු ලබයි

**<u>ඇ) රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙ අධ්‍යක්ෂක ජනරාල්ගේ ලිපි අංක. පී ඊ /1 /174 /11 (ඩී)</u>**

ගෙවීම් සිදුකරන ලද්දේ වි.වි.ප්‍ර.කො. සහා චක්‍රලේඛ හා නිර්ණායකයන්ට අනුවය. කෙසේවුවත් 2003.01.01 දිනට පසුව බඳවා ගත් සේවකයින්ට මෙම දිමනාව ගෙවා නොමැත.

**<u>ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරයේ ආයතන සංග්‍රහයේ xxx පරිච්ඡේදයේ 1.4 වන වගන්තිය</u>**

- බාහිර කථිකාචාර්යවරුන්ට ලබා දි ඇති පත්වීමේ ලිපියෙහි, ඔවුන් අදාල දෙපාර්තමේන්තුවෙ අනුමැතිය ලබා ගත යුතු බව පැහැදිලිව දක්වා ඇත .
- විශ්ව විද්‍යාලයේ පාලන අධිකාරියේ අනුමැතිය ඇතිව ගෙවීම් සිදුකර ඇත .

**ඉ) 1997.11.21 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) මග පෙන්වීම අනුව අප මේ සම්බන්ධයෙන් වි.වි.ප්‍ර.කො සභාවේ උපදෙස් බලාපොරොත්තුවෙන් සිටිමු.

**3 මූල්‍ය සමාලෝචනය**

3.1 මූල්‍ය ප්‍රතිඵල සටහන් කර ගතිමි

**4 මෙහෙයුම් සමාලෝචනය**

4.1 කාර්ය සාධනය
(අ) සටහන් කර ගතිමි.

(අ) (ආ) සටහන්කර ගතිමි. කෙසේ වුවද ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් කර දීම සිදුකරනු ලබන්නේ වි.වි.ප්‍ර.කො විසිනි.

(ඇ) ප්‍රදේශයට නැවත නැවතත් ඇති වූ ගංවතුර තත්වයන් හේතුවෙන් විභාග පැවැත්වීමේ පමාවක් ඇතිවිය. කෙසේ නමුත් නැවත පරීක්ෂණය සඳහා සහභාගි වූ සිසුන් 22 කගේ ප්‍රතිඵල පසුව නිකුත්කරනු ලැබිය.

4.2 (අ) සටහන් කර ගතිමි
(ආ) සටහන් කර ගතිමි

4.3 (අ) සටහන් කර ගතිමි
(ආ) සටහන් කර ගතිමි
(ඇ) සටහන් කර ගතිමි

**4.4 අධිකාරී බලයක් නොමැති ගනුදෙනු**

(අ) මෙය මේ වන විට නිවැරදි කර ගෙන ඇති අතර විශ්ව විද්‍යාලය ප්‍රවාහන පහසුකම් සපයනු ලබයි.

(ආ) මෙය මේ වන විට නිවැරදි නර ගෙන ඇති අතර වි.වි.ප්‍ර.කො සභාවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටිමි.

**4.5 වත්කම් කළමණාකරණය**

පාවිච්චි කල නොහැකි භාණ්ඩ මුදල් කමිටුවේ/පාලක සභාවේ අනුමැතිය ඇතිව අපහරණය/කපා හැරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට 8 වැනි විගණන කමිටු රැස්වීමේ දි නිර්දේශ කර ඇත.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

මෝටර් කාර් රථයක් උප කුලපති වෙත වෙන් කර දී ඇත. ඉතිරියෙන් කැබ් රථ 2ක් අවුරුදු 17 පැරණි වන අතර එය භාවිතය ආර්ථික නොවන අතරම දිගු ගමන් සඳහා විශ්වාසයෙන් භාවිතා කල නොහැකි මේ හේතුවෙන් වාහන අවශ්‍යතාවය පැනනැගුණු බැවින් විශ්ව විද්‍යාලය වාහන කුලී පදනම මත ලබාගෙන ඇත.

**4.7 ව්‍යාපෘති ප්‍රමාදයන්**

අග්නිදිග විශ්ව විද්‍යාලයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා උපදේශකයෙකු ලෙස "ARUP" යොදවා ගැනීමට ක්‍රියාකරනු ලැබුවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමය.ප්‍රධාන සැලැස්ම විදිමත්ව සකස් කිරීම "ARUP" වෙත පවරන ලදි. ප්‍රාථමික ප්‍රධාන සැලැස්ම විශ්ව විද්‍යාලයට බාර දී ඇත. ප්‍රාථමික ප්‍රධාන සැලැස්ම සමාලෝචනය කිරීමට හා යාවත්කාලින කිරීමට වි.වි.ප්‍ර.කො එකගතාවය ඇතිව මොරටුව "යුනි කන්සල්ටන්සි" ආයතනය වෙත භාර දී ඇත. මේ වන විට මෙම පැවරුම සම්පූර්ණ කිරීමට ආසන්න තත්වයේ පවති.

## 4.8 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය

(අ) ප්‍රසම්පාදන පද්ධතියේ අඩුලුහුඬුකම්

(අ) ඉදිරියේදී අනුකූල වීම සඳහා සටහන් කර ගතිමි

(ආ) පැවති ගෘහ භාණ්ඩ නව සභාශාලාවක් වෙත මාරුකරන ලද බැවින් සභාශාලා ගෘහභාණ්ඩ ඉල්ලීමක් උප කුලපති කාර්යාලය විසින් කරන ලදි. ප්‍රදේශයේ සැපයුම් කරුවන්ගෙන් මේ සඳහා මිල කැඳවුම් ලබා ගන්නා ලදි. භාණ්ඩ වලින් කොටසක් සැපයූ පසුව රු 1,844,573 ක කොටස් ගෙවීමක් සිදුකර ඇත.

## 4.9 මතභේදයට තුඩුදෙන ස්භාවයේ ගණුදෙණු

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COAP) 2011 ජුනි 7 වන දින ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ කාර්යසාදනය සමාලෝචනය කරන අවස්ථාවේදි මෙම කරුණ මතු කරනු ලැබිය. මේ වන විට මෙම සමාගම සැපයුම්කරුවෙකු නොවන අතර අදාල තැනැත්තා පාලක සභා සාමාජිකයෙකු ද නොවේ.

## 5.1 සංයුක්ත සැලැස්ම

මොරටුව විශ්වවිද්‍යාලයේ “යුනි කන්සල්ටන්සි” සහය ඇතිව 2012-2016 දක්වා නව සංයුක්ත සැලැස්මක් සකස් කර ඇත. මෙය විගණනය සඳහා ඉදිරිපත් කල හැක.

## 5.2 වාර්ෂික වාර්තාව සාකච්ඡාවට බඳුන් කිරීම

මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත.

## 5.3 අයවැය පාලනය

වියදම් අයිතම කිහිපයක අහිතකර විචලනයන් පැවතියද පොදුවේ පුද්ගල පඩි නඩි සැපයුම් නඩත්තු ගිවිසුම් ගත සේවා සහ වෙනත් පුරාවර්ථන වියදම් වැනි සෑම විශයයකම පාහේ හිතකර විචලනයන් නිරික්ෂණය කල හැක.

## 6.0 පද්ධති හා පාලන

(අ) සටහන් කර ගතිමි.

(ආ) වත්කම් භෞතික සත්‍යෙක්ෂණය සිදුකරමින් පවති.

(ඇ) අත්තාකාරම් ගෙවීමේ දි මේවන විට නිෂ්චිත ප්‍රතිපත්ති යොදාගනු ලබයි.

(ඈ) සටහන් කර ගතිමි. නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) එක් කථිකාචාර්යවරයෙක් සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ඔහුගේ අර්ථසාදක අරමුදලෙන් අය කර ගැනිමට කැමැත්ත පලකල ඇති අතර ඒ අනුව කටයුතු කරනු ලැබේ. අනෙක් කථිකාචාර්යවරයාද සම්පූර්ණ අර්ථ සාදක අරමුදල බැඳුම්කර වටිනාකමින් පාර්ශවික නිරවුල් කිරීමක් ලෙස හිලව් කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

(ඊ) සටහන් කර ගතිමි.

ආචාර්ය එස්.එම්.මොහොමඩ් ඉස්මයිල්
උප කුලපති

පිටපත් : ලේකම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
සභාපති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව